*සැ. යු.* — 2013.11.29 වැනි දින පළ වූ අංක 1,839 දරන *ගැසට් පත්‍රයේ* I : III, III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,840 - 2013 දෙසැම්බර් මස 06 වැනි සිකුරාදා - 2013.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2996 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 3007 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 3023 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* -(i) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත 2013 ඔක්තෝබර් මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා ප්‍රභා ලේඛක සමිති සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 27 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 දෙසැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය අනුව ඈවරකර අවසන් කිරීම

පහත සඳහන් සමුපකාර සමිති ඒ ඒ සමිතියේ නම ඉදිරියේ දක්වා ඇති දිනයන්හි ඈවරකර අවසන් වූ බව 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 (2) වගන්තිය අනුව දැනුම් දෙනු ලැබේ.

**කුරුණෑගල කොට්ඨාසය**

| *අනු. අංකය* | *පෙර තිබූ ලියාපදිංචි අංකය* | *සමිතියේ නම* | *වසා දමන ලද දිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 01 | කු/1794 | සී./ර. කිරිවවුල සිවුතුරු සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.11.14 | කුරුණෑගල |
| 02 | වප/මාස්/5 | සී/ර. සිවල්ලවගෙදර පුබුදු සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.11.04 | එම |
| 03 | වප/කු/424 | සී/ස. මාවතගම එකමුතු තුරුණුසෙවන ඉදිකිරීම් සමුපකාර සමිතිය | 2012.11.03 | එම |
| 04 | වප/කු/64 | සී/ස. කලගහ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.17 | එම |
| 05 | වප/කු/241 | සී/ස. නාරම්මල පෙදෙරේරු හා වඩුකාර්මිකයින්ගේ ඉදිකිරීම් හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.17 | එම |
| 06 | කු/1598 | සී/ස. පැල්ලන්දෙනිය කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.17 | එම |
| 07 | වප/කු/95 | සී/ස. කැන්දවල ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.31 | එම |
| 08 | වප/කු/167 | සී/ස. ගල්වලාගාරය ජය නියතයි ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.31 | එම |
| 09 | කු/1775 | සී/ස. මඩිහේ දේතිළිඅංග එකමුතු සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.31 | එම |
| 10 | කු/1964 | සී/ස. ගනේවත්ත එස්. බී. හේරත් මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.31 | එම |
| 11 | කු/2069 | සී/ස. අලව්ව කනිෂ්ඨ විදුහල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 12 | වප/කු/264 | සී/ස. අගාරේ ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 13 | කු/1878 | සී/ස. කළුගමුව කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 14 | කු/1929 | සී/ස. මහාදිවුල්වැව ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 15 | - | සී/ස. නුගවෙල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 16 | කු/562 | සී/ස. පෙතන්ගල්ල සුබ සාධන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 17 | කු/1756 | සී/ර. මල්දෙණිය සුහද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 18 | වප/කු/165 | සී/ස. වල්පොලකන්ද ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 19 | වප/කු/435 | සී/ස. මහයාය නවෝද්‍යා කර්මාන්තකරුවන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 20 | - | සී/ස. දෙල්විට මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 21 | වප/කු/56 | සී/ස. ගනේකොළණිය ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 22 | වප/රස්/07 | සී/ස. ආලම්කුලම කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | කුරුණෑගල |
| 23 | කුලි/343 | සී/ර. ඉහළ දම්පිටිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 24 | වප/කු/382 | සී/ස. මැදවච්චිය පුබුදු කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 25 | වප/කු/335 | සී/ස. ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 26 | වප/කු/417 | සී/ස. හිද්දෑව සමගි කාන්තා ස්වශක්ති සත්කාර්ය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 27 | වප/කු/223 | සී/ස. පාළුගම ශක්ති ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 28 | කු/2050 | සී/ස. මාළුලිය විද්‍යාලයීය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 29 | කු/2025 | සී/ස. කු/තඹගල්ල පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 30 | කු/409 | සී/ස. දම්පිටිය කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 31 | කු/1657 | සී/ර. දේවාලේපොළ සපුමල්ගම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 32 | වප/කු/පො/11 | සී/ස. නිජබිම ස්වශක්ති පදනම ගනේගොඩ දකුණ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 33 | කු/117 | සී/ස. වයඹ රූපවර්ධන ශිල්පී සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 34 | වප/කු/246 | සී/ස. ගොන්නව දිමුතු ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 35 | වප/කු/230 | සී/ස. ශ්‍රමසහයෝගිතා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 36 | කු/88/1489 | සී/ස. අලව්ව මහා විදුහල් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 37 | වප/කු/158 | සී/ස. නැගෙනහිර වෙන්නෝරුව එක්සත් ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 38 | K/556 | සී/ස. බුලත්වත්ත පළාත මිල්ලගහමුලකඩේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.02.18 | එම |
| 39 | වප/කු/257 | සී/ස. අලව්ව පෙදරේරු හා වඩුකාර්මිකයින්ගේ ඉදිකිරීම් හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2013.02.18 | එම |
| 40 | වප/කු/414 | සී/ස. පොල්ගහවෙල උතුර නවෝද්‍යා සත්කාර ස්වශක්ති | 2013.02.18 | එම |
| 41 | වප/කු/212 | සී/ස. ගොඩනුරුව සමගි ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමිතිය | 2013.02.18 | එම |
| 42 | වප/කු/209 | සී/ස. දෙමටගොල්ල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.02.18 | එම |
| 43 | කුලි/401 | සී/ස. දිවුල්ලෑව කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2013.03.13 | එම |
| 44 | කු/1772 | සී/ර. කහපත්වල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.03.13 | එම |
| 45 | කු/2044 | සී/ස. උඩුගම මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.03.13 | එම |
| 46 | වප/කු/172 | සී/ස. උයන්දන කහඳවැල්හේන ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.03.13 | එම |
| 47 | කු/1987 | සී/ස. මීනුවන්ගැටේ මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.03.14 | එම |
| 48 | වප/කු/386 | සී/ස. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි නිලධාරි සුබසාධක සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.03.21 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 49 | වප/කු/500 | සී/ර. කහටගොල්ල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.03.19 | කුරුණෑගල |
| 50 | කු/1783 | සී/ර. රුක්ගොල්ල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.03.21 | එම |
| 51 | කු/1746 | සී/ර. කොල්ලුපුර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.04.02 | එම |
| 52 | වප/කු/211 | සී/ස. දේවගිරිය ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.04.17 | එම |
| 53 | kdss/90 | සී/ස. පරණගම ප්‍රාථමික විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.05.02 | එම |
| 54 | වප/කු/94 | සී/ස. පැලවත්ත ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.05.06 | එම |
| 55 | වප/කු/468 | සී/ස. මහකෙළිය කෙළිමුනේ නිෂ්පාදන ගම්මාන සමුපකාර සමිතිය | 2013.06.04 | එම |
| 56 | කු/1744 | සී/ර. වදුරුස්ස සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.06.11 | එම |
| 57 | වප/කු/26 | සී/ස. වේගොල්ල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.06.04 | එම |
| 58 | වප/කු/138 | සී/ස. මීවැව ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.06.04 | එම |
| 59 | වප/කු/49 | සී/ස. කීරම්වැල්ල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.06.04 | එම |
| 60 | වප/කු/342 | සී/ස. ග්‍රීන්වුඩ් මැටිබොක්ක නැගෙනහිර ප්‍රජා සමුපකාර සමිතිය | 2013.07.25 | එම |
| 61 | වප/කු/342 | සී/ස. දියතුරේ ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.07.25 | එම |
| 62 | කු/1726 | සී/ර. දොඩම්ගස්ලන්ද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.08.02 | එම |
| 63 | වප/කු/188 | සී/ස. මානෙල් ඔළුව ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.08.07 | එම |
| 64 | වප/කු/140 | සී/ස. හීනුග්ගල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.08.13 | එම |
| 65 | කු/1797 | සී/ර. ඉබ්බාගමුව පන්නල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.08.22 | එම |
| 66 | කු/1809 | සී/ර. උඩත්තාපොල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.08.14 | එම |
| 67 | කුලි/1368 | සී/ර. මීකොලපිටිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.08.14 | එම |
| 68 | කේයූ/එස්එස්/ 665 | සී/ර. මඩවල ආණ්ඩුවේ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.08.14 | එම |
| 69 | වප/කු/272 | සී/ස. එකමුතු ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.08.14 | එම |
| 70 | වප/කු/78 | සී/ස. වීරේ ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.08.29 | එම |
| 71 | කේයූ/එස්එස්/ 66 | සී/ස. තිරගම මහ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.08.29 | එම |
| 72 | වප/කු/434 | සී/ස. මඩදෙනිගම රත්තරන් කර්මාන්ත ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | 2013.08.29 | එම |
| 73 | වප/කු/148 | සී/ස. අඹකොළවැව ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2013.08.28 | එම |
| 74 | වප/කු/58 | සී/ස. අඹන්පොල කහටගහවෙල නැකැත්ත ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 75 | වප/කුරු/18 | සී/ස. වැල්ලව පොල් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 76 | වප/කු/148 | සී/ස. පිටපහමුන ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.10.01 | කුරුණෑගල |
| 77 | 306 | සී/ස. කට්ටම්බේරිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 78 | වප/කු/34 | සී/ස. වැවලගම ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 79 | වප/කු/වාරි/ප්‍රලේ/26 | සී/ස. හොරොම්බුව එක්සත් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 80 | කේයු/එස් එස්/06 | සී/ස. වටරුක පාසල් සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 81 | කු/1817 | සී/ර. කට්ටම්බේරිය සකසුරුවම් ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 82 | වප/කු/483 | සී/ස. මීරිහානේගම කලුබුලත් නිෂ්පාදන ගම්මාන සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 83 | වප/කු/137 | සී/ස. ගලපාටමුල්ල ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 84 | වප/කු/258 | සී/ස. තලංගමුව දිග්ගලවත්ත ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 85 | වප/කු/140 | සී/ස. මානින්ගමුව ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 86 | කු/1919 | සී/ර. කිරිබමුණුවගම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 87 | කු/1795 | සී/ර. කෝවාන සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |
| 88 | වප/කු/51 | සී/ස. පන්ලියද්ද ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2013.10.09 | එම |
| 89 | වප/කු/430 | සී/ස. ගල්කඩවල ස්වශක්ති කාන්තා සත්කාර්ය සමුපකාර සමිතිය | 2013.10.09 | එම |

**කුලියාපිටිය කොට්ඨාසය**

| | | | | |
|---|---|---|---|---|
| 90 | - | සී/ස. ආඩිගම කිරි සමිතිය | 2012.12.28 | එම |
| 91 | වප/කුලි/84 | සී/ස. හමන්ගල්ල ගොවිජන බලප්‍රදේශයේ පොල් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 92 | වප/කු/පන්/12 | සී/ස. ගලයාය කොහු අත් භාණ්ඩ නිජබිම ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 93 | - | සී/ස. හමන්ගල්ල ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 94 | කුලි/55/47 | සී/ස. නාරන්ගොඩ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 95 | වප/කු/පන්/18 | සී/ස. නාලවලාන ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 96 | වප/කු/පන්/16 | සී/ස. දාරළුව ගණන්කැටේ ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 97 | වප/කු/පන්/24 | සී/ස. නිජබිම ස්වශක්ති සමුපකාර සමිතිය, ගෝනුල්ල | 2012.12.28 | එම |
| 98 | - | සී/ස. කොළඹගම කෘෂි ඵලදායිතා සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 99 | - | සී/ස. කොළඹගම පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 100 | - | සී/ස. වන්නිගම ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 101 | වප/කු/කො/19 | සී/ස. කිතගම ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 102 | වප/කුලි/140 | සී/ස. සියඹලාගස්වැටිය සිරි සුමන විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | කුරුණෑගල |
| 103 | වප/කු/කො/34 | සී/ස. වත්තේගෙදර ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 104 | වප/කුලි/23 | සී/ස. මුරුක්කණ්ඩිය එකමුතු සත්කාර්ය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 105 | කු/2102 | සී/ස. වැවගම විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 106 | වප/කුලි/01 | සී/ස. කටුපොත පොල් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 107 | කුලි/126 | සී/ස. කදානේගෙදර ධර්මපාල මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2013.07.21 | එම |
| 108 | වප/කුලි/145 | සී/ස. බිංගිරිය ප්‍රගති සත්කාර්ය සමුපකාර සමිතිය | 2013.08.07 | එම |
| 109 | වප/කු/කො/17 | සී/ස. හාතලව වයඹ ස්වශක්ති සමුපකාර සමිතිය | 2013.09.01 | එම |

**හලාවත කොට්ඨාසය**

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 110 | හලා/432 | සී/ස. නාත්තණ්ඩිය සංවර්ධන සමුපකාර සමිතිය | 2012.11.28 | පුත්තලම |
| 111 | හලා/519 | සී/ස. ලුණුවිල උතුර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.11.28 | එම |
| 112 | වප/පු/වෙන්/501 | සී/ස. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ධීවර නිෂ්පාදන සැකසුම් හා අලෙවි සමුපකාර සමිතිය | 2012.12.31 | එම |
| 113 | හලා/594 | සී/ර. නැ/දුම්මලදෙනිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 114 | හලා/435 | සී/ස. බණ්ඩිරිප්පුව ගොවි ද්‍රව්‍ය නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 115 | හලා/446 | සී/ස. බණ්ඩිරිප්පුව කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 116 | හලා/612 | සී/ර. ද/උල්හිටියාව තිළිණ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 117 | හලා/581 | සී/ස. බ/දුම්මලදෙණිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 118 | හලා/791 | සී/ස. පුත්/දිස්ත්‍රික් ටුවයින් ලණු නිෂ්පාදන ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 119 | හලා/370 | සී/ස. මනක්කුලම විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 120 | හලා/355 | සී/ස. මාදම්පේ මධ්‍ය මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 121 | පී.එම්.එස්. 51 | සී/ස. මහගම පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 122 | හලා/374 | සී/ස. මගුණුවටවන පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 123 | හලා/685 | සී/ස. ශුද්ධ ජපමාලා ඔලිදළුව ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 124 | පී.එම්.එස්. 19 | සී/ස. පුලියන්කාර බෞද්ධ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 125 | වප/පු/නා/02 | සී/ස. කටුනේරිය විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 126 | හලා/762 | සී/ස. හත්තිනය රජයේ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 127 | හලා/763 | සී/ස. හලා/මහවැව ධර්මරාම පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 128 | හලා/356 | සී/ස. නාරවිල ගුණරත්න විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 129 | වප/පු/නා/04 | සී/ස. මුදුකටුව පාතිමා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 130 | හලා/351 | සී/ස. මාරවිල මහින්ද පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 131 | හලා/368 | සී/ස. නාත්තණ්ඩිය රෝමානු කතෝලික පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 132 | හලා/368 | සී/ස. පලුවැල්ගාල රජයේ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 133 | වප/පු/නා/10 | සී/ස. නාත්තණ්ඩිය පුෂ්ප ලංකා මල් වවන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 134 | හලා/805 | සී/ස. මයුර ලංකා විසිතුරු උත්පාදකයින්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 135 | සී/526 | සී/ර. කොස්වාඩිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 136 | කේ/යූ/461 | සී/ර. මීගහවෙල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 137 | හලා/178 | සී/ර. මැද කොස්වාඩිය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 138 | හලා/890 | සී/ස. බ/ඉරණවිල සදාසරණ ස්වශක්ති සත්කාර්ය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 139 | NWP/CH/ AC/917 | සී/ස. මොරකැලේ කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 140 | හලා/809 | සී/ස. දියබුබුලාගාර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 141 | NWP/CH/ AC/920 | සී/ස. කොස්වාඩිය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 142 | NWP/CH/ AC/944 | සී/ස. මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුරුණුසෙවන ඉදිකිරීම් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 143 | හලා/795 | සී/ස. මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල් හා ගෘහ ආශ්‍රිත නිෂ්පාදන සුපිපි මල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 144 | හලා/770 | සී/ස. නාත්තණ්ඩිය ලූර්දු විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 145 | හලා/870 | සී/ස. ද/තොඩුවාව ශා/මරියා සත්කාර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 146 | හලා/523 | සී/ර. වනාතවිල්ලුව සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 147 | හලා/554 | සී/ස. එලුවන්කුලම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 148 | හලා/419 | සී/ස. පුත්/පාතිමා බාලිකා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 149 | වප/පු/පු/09 | සී/ස. පුත්/සහිරා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 150 | වප/පු/පු/05 | සී/ස. අට්ටවිල්ලුව රජයේ විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 151 | වප/පු/පු/12 | සී/ස. පුත්/අංක 01 පොල් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 152 | හලා/799 | සී/ස. කොච්චිමඩුකවෙයි නිවාස සංවර්ධන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 153 | පී.එම්. 287 | සී/ස. පුත්/පොදු කම්කරු සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු. අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 154 | පී. එම්. 290 | සී/ස. අට්ටවිල්ලුව කම්කරු සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 155 | කේ. යූ. 131 | සී/ස. පුත්තලම රජයේ සේවක කඩ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 156 | හලා/786 | සී/ස. මධ්‍යම අට්ටවිල්ලුව ආසිරිගම ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 157 | හලා/789 | සී/ස. පුත්/අංක 06 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 158 | හලා/883 | සී/ස. වනාතවිල්ලුව තම්මැන්නා සත්කාර්ය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 159 | වප/පු/පු/04 | සී/ස. හලා/කාර්මේල් බාලිකා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 160 | හලා/766 | සී/ස. හලා/මැති.කො. ඌරන් ඇතිකරන්නන්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 161 | හලා/768 | සී/ස. දේවාල හංදිය වඩු කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 162 | හලා/KU/42 | සී/ස. කරුක්කුලිය විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 163 | හලා/495 | සී/ස. කිරිමුන්දලම ධීවර කාර්මිකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 164 | හලා/498 | සී/ර. නොරොච්චෝලේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 165 | හලා/561 | සී/ර. පෙරියසන්දි ග්‍රාම එළවලු නිපදවන්නන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 166 | හලා/571 | සී/ර. මරවන්සේන සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය-කල්පිටිය | 2012.12.28 | එම |
| 167 | හලා/582 | සී/ර. අල්ජුම්මා සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය-කල්පිටිය | 2012.12.28 | එම |
| 168 | හලා/723 | සී/ස. ශා/ආනා තලවිල ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 169 | හලා/747 | සී/ස. මණ්ඩලකුඩා ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 170 | හලා/722 | සී/ස. කන්දක්කුලිය ශාන්ත ස්ටීවන් ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 171 | හලා/669 | සී/ස. ශා/පාවුලු මුදලක්පාලි ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 172 | හලා/695 | සී/ස. ඉච්චන්කඩුව කන්දක්කුලිය ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 173 | හලා/663 | සී/ස. ශා/සෙබස්තියන් පණිඅඩිය ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 174 | හලා/666 | සී/ස. බත්තලන්ගුණ්ඩුව වික්ශෝප මාතා ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 175 | හලා/744 | සී/ස. පුත්/දිස්. ව්‍යාපෘති නිලධාරීන්ගේ ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 176 | හලා/665 | සී/ස. ශා/අන්තෝනි කුරිංචිචම්පිටිය දකුණ ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 177 | හලා/710 | සී/ස. ඩබ්බේ ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 178 | එන්.ටී.එස්.එන්. 17 | සී/ස. නාරක්කල්ලිය මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 179 | හලා/579 | සී/ර. නවගත්තේගම සකසුරුවම් හා ණයගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 180 | හලා/454 | සී/ර. නවෝදව ගොවි ජනපද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 181 | වප/පු/නව/20 | සී/ර. ඉඟිනිමිටිය ප්‍රගති සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 182 | වප/පු/නව/11 | සී/ර. මොරගහවැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 183 | වප/පු/නව/01 | සී/ස. කෝන්කඩවල දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 184 | වප/පු/නව/02 | සී/ස. මුල්ලේගම දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 185 | වප/පු/නව/04 | සී/ස. කැලේවැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 186 | වප/පු/නව/06 | සී/ස. ඉඟිනිමිටිය බ/දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 187 | වප/පු/නව/08 | සී/ස. කුරුලුවැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 188 | වප/පු/නව/07 | සී/ස. අමුණු වැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 189 | වප/පු/නව/12 | සී/ස. මහඅන්දරවැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 190 | වප/පු/නව/13 | සී/ස. තම්මැන්නා වැටිය දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 191 | වප/පු/නව/14 | සී/ස. මහමද්දෑව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 192 | වප/පු/නව/15 | සී/ස. කිරිමැටියාව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 193 | වප/පු/නව/16 | සී/ස. ඉඟිනිමිටිය නැගෙනහිර දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 194 | වප/පු/නව/17 | සී/ස. සමෘද්ධිගම දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 195 | වප/පු/නව/18 | සී/ස. රඹකනයාගම දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 196 | වප/පු/නව/19 | සී/ස. කරණගහවැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 197 | වප/පු/නව/08 | සී/ස. කුරුලු වැව දිරිය පෙරට කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 198 | වප/පු/කරු/02 | සී/ර. එරබදුගස් වැව සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 199 | වප/පු/කරු/03 | සී/ස. ස්වශක්ති පදනම මැහගම කාන්තා සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 200 | වප/පු/කරු/04 | සී/ස. ස්වශක්ති පදනම මැදගම කාන්තා සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 201 | වප/පු/කරු/07 | සී/ස. තබ්බෝව උතුර කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 202 | වප/පු/කරු/08 | සී/ස. තබ්බෝව දකුණ කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 203 | වප/පු/කරු/09 | සී/ස. ස්වශක්ති පදනම පාහරිය කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 204 | වප/පු/කරු/10 | සී/ස. කරවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 205 | වප/පු/කරු/01 | සී/ස. තබ්බෝව මහා විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 206 | එන්.ටී.එස්.03 | සී/ස. ගලවැව විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 207 | හලා/726 | සී/ස. 642-638 සාලියවැව ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 208 | හලා/765 | සී/ස. ආණ/රාජංගනය සාලියවැව විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 209 | වප/පු/මකු/05 | සී/ර. ගරායක්කම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 210 | වප/පු/මකු/02 | සී/ර. පුනවිටය සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 211 | හලා/535 | සී/ර. මරුත්ගොඩපලාත සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 212 | හලා/502 | සී/ර. ආණමඩුව උතුර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 213 | හලා/510 | සී/ර. ආණමඩුව සමඟි සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 214 | හලා/530 | සී/ර. කරබෑව පළාත සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 215 | හලා/508 | සී/ර. කඩයන්කුලම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 216 | හලා/556 | සී/ර. බරතන්කට්ටුව සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 217 | හලා/602 | සී/ර. ආණමඩුව දකුණ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 218 | හලා/527 | සී/ර. මැල්ලම්කුලම පළාත සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 219 | හලා/582 | සී/ර. මදවක්කුලම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 220 | වප/පු/ආණ/38 | සී/ස. ඇතුන්ගොඩ කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 221 | වප/පු/ආණ/39 | සී/ස. හය ගම්මානය කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය, ඇතුන්ගොඩ | 2012.12.28 | එම |
| 222 | වප/පු/මකු/03 | සී/ස. මොහොරිය කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 223 | හලා/6332 | සී/ස. සින්ද්‍රන්ත්‍රිය කලයාගම කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 224 | වප/පු/ආණ/40 | සී/ස. දිවුල්වැව කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 225 | වප/පු/ආණ/05 | සී/ස. පාලියාගම විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 226 | වප/පු/ආණ/03 | සී/ස. මුදලක්කුලිය විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 227 | වප/පු/ආණ/02 | සී/ස. සියඹලාගස්හේන විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 228 | වප/පු/ආණ/07 | සී/ස. සංගට්ටිකුලම විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 229 | හලා/386 | සී/ස. කොට්ටුකච්චිය විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 230 | වප/පු/මකු/07 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම-612 ඒ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 231 | වප/පු/මකු/09 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම කිවුලගොඩ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 232 | වප/පු/මකු/14 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම කවයන්කුලම සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 233 | වප/පු/මකු/15 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම ජයරාජපුර ජයමිණි සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 234 | වප/පු/මකු/20 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම ලිහිණිගිරිය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 235 | වප/පු/මකු/21 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම වල්පාළුව විසාකා සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 236 | වප/පු/මකු/22 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම මොහොරිය සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 237 | වප/පු/මකු/26 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 614සී මහකුඹුක්කඩවල සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 238 | වප/පු/ආණ/09 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 650 කොයිලාඩිගම සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 239 | වප/පු/ආණ/10 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 651/7 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 240 | වප/පු/ආණ/13 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 653/බී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 241 | වප/පු/ආණ/14 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 661 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 242 | වප/පු/ආණ/15 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 650/බී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 243 | වප/පු/ආණ/17 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 650/බී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 244 | වප/පු/ආණ/18 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 658 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 245 | වප/පු/ආණ/11 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 659ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 246 | වප/පු/ආණ/20 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 655 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 247 | වප/පු/ආණ/19 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 653බී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 248 | වප/පු/ආණ/24 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 659ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 249 | වප/පු/ආණ/25 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 656 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 250 | වප/පු/ආණ/26 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 656 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 251 | වප/පු/ආණ/27 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 694ඩී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 252 | වප/පු/ආණ/28 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 658 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 253 | වප/පු/ආණ/29 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 656ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 254 | වප/පු/ආණ/30 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 652ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 255 | වප/පු/ආණ/31 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 655ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 256 | වප/පු/ආණ/32 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 649 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 257 | වප/පු/ආණ/35 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 652 ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 258 | වප/පු/ආණ/36 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 653ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 259 | වප/පු/ආණ/37 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 653සී ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 260 | වප/පු/ආණ/38 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම 657ඒ ගම්මාන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 261 | වප/පු/මකු/23 | සී/ස. නිජබිම කාන්තා ස්වශක්ති පදනම ගරායක්කම සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 262 | හලා/563 | සී/ර. මුන්දලම සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 263 | හලා/761 | සී/ස. සෙරුක්කුවට්ටාන් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 264 | හලා/598 | සී/ර. උඩප්පුව සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 265 | හලා/460 | සී/ර. මදුරන්කුලිය ශ්‍රී සරණංකර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |

| අනු අංකය | පෙර තිබූ ලියාපදිංචි අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 266 | හලා/775 | සී/ස. මදුරන්කුලිය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | පුත්තලම |
| 267 | කේ.යූ.එම්.එන්. 25 | සී/ස. මුන්දලම රෝමානු කතෝලික විද්‍යාලයීය පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 268 | හලා/800 | සී/ස. මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉස්සන් වගා හා අපනයන සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 269 | හලා/827 | සී/ස. පල්ලිවාසල්පාඩුව යාත්‍රා සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 270 | හලා/806 | සී/ස. උඩප්පුව වීර භද්‍රකාලී අම්මාන් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 271 | හලා/862 | සී/ස. නිර්මල මාතා පු/කන්දාලේ පාසල් සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 272 | හලා/873 | සී/ස. උඩප්පුව ස්ටාර් සත්කාර ස්වශක්ති සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 273 | හලා/484 | සී/ර. කාක්කපල්ලිය එක්සත් සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 274 | හලා/583 | සී/ස. කුරක්කුවටවන සුහද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2012.12.28 | එම |
| 275 | හලා/444 | සී/ස. පිලාකටුමුල්ල කිරි නිපදවන්නන්ගේ ප්‍රාථමික සමුපකාර සමිතිය | 2013.08.07 | එම |
| 276 | හලා/614 | සී/ස. ශාන්ත රීටා ජනපදවාසීන්ගේ සමුපකාර සමිතිය | 2013.08.29 | එම |
| 277 | හලා/430 | සී/ස. හලාවත පුත්තලම් දෙඩ්සාවේ තරුණ ධීවර කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | 2013.09.10 | එම |
| 278 | හලා/1599 | සී/ර. නාත්තඩවර සුහද සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.09.10 | එම |
| 279 | හලා/493 | සී/ර. තඹගල්ල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2013.10.01 | එම |

ඩී. එම්. කේ. සී. දිසානායක,
සමුපකාර සංවර්ධන කොමසාරිස්,
රෙජිස්ට්‍රාර් (වයඹ).

2013 ඔක්තෝබර් මස 31 වැනි දින,
වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පළමු මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

12-01

---

## පළාත් සභා නිවේදනය

### නැගෙනහිර පළාත් සභාව

2013 අංක 1 දරන විසර්ජන ප්‍රඥප්තිය (පරිපූරක විධිවිධාන) 2013 ඔක්තෝබර් මස 29 වැනි දින සභා සම්මත කරන ලද බවත්, මේ සඳහා වූ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2013 නොවැම්බර් මස 01 වැනි දින ලැබී ඇති බවත් මෙයින් දන්වමි.

කණපතිපිල්ලෙයි කරුණාගරන්,
සභා ලේකම්,
නැගෙනහිර පළාත් සභාව.

2013 නොවැම්බර් මස 12 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාත් සභාව,
ත්‍රිකුණාමලය.

12-33

# අතුරු ව්‍යවස්ථා

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 දරන වගන්තියෙන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, මෙම අතුරු ව්‍යවස්ථාව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ කවර හෝ මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

(ආ) මියගිය තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන නඩු විධාන සංග්‍රහ පනත යටතේ මහෙස්ත්‍රාත්වරයකු හෝ මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබූ, එකී පරීක්ෂණ අවසානයේ මෘත දේහ ආදාහනය කිරීමට එකී මහෙස්ත්‍රාත්වරයා හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

(ඇ) මියගිය යම් තැනැත්තකුගේ මරණ සහතිකයේ 7 වැනි තීරුවේ "මරණයට හේතුව හා භූමදාන හෝ ආදාහනය කළ ස්ථානය" යන්නෙහි, දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ අදාළ ආදාහනාගාරය නම්කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීමට හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

3. (අ) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකි ය.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර ආදාහනාගාරය වෙන් කරවා ගැනීමට අයදුම්පත්‍ර භාර ගන්නා ස්ථානයේ සහ ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කළ යුතු ය.

(ඇ) දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම පුද්ගලයෙකු විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවා අවසර ගත යුතු ය.

(ඈ) සභාවේ දැනට සේවය කරන ලද යම්කිසි සභාපතිවරයකුගේ, උපසභාපතිවරයකුගේ, මන්ත්‍රීවරයකුගේ හෝ සභාවේ සේවකයකුගේ ද සභාවේ කලින් සේවය කරන ලද සභාපතිවරයකුගේ, උප සභාපතිවරයකුගේ, මන්ත්‍රීවරයකුගේ ද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ.

(ඉ) මෘත ශරීර ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරයට භාරදීමෙන් පසුව ආදාහනය කරන අතරතුරේ දී හෝ ආදාහනය කිරීමට පෙරාතුව හෝ ආදාහනාගාර යන්ත්‍ර සූත්‍ර වල කාර්මික දෝෂයක් හෝ විදුලි ඇනහිටීමක් හෝ නිසා මෘත දේහය ආදාහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘතදේහය භූමදානය කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතු ය.

4. 2 වැනි වගන්තියේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තකු, මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි 2 වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(අ) මියගිය තැනැත්තා හා ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කිරීමට අදාළ කරගත හැකිවනු පිණිස -

01. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත,
02. මියගිය අයගේ ජාතික හැඳුනුම්පත/මියගිය අයගේ උප්පැන්න සහතිකය (ඇත්නම්),
03. ඉල්ලුම්කරු පදිංචිව සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ සහතිකය ;

(ආ) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එකී පරීක්ෂණය පවත්වන ලද මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41 (ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම් උප්පැන්න හෝ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය ; සහ

(ඇ) මියගිය තැනැත්තාගේ මරණ සහතිකය.

5. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම්, එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි 5 වැනි උපලේඛනයේ ලේඛනගත

කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛන අයදුම්පත් භාරගන්නා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ පවත්වා ගත යුතු ය.

6. ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පතකට අනුව යම් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණය කරන ලද්දේ නම්, පළමු වැනි උපලේඛනය අනුව පවත්වන ලද නියමිත ගාස්තු අයකර ගැනීමෙන් පසු සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසර පත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

7. කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම්, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතුවූ කරුණු ද සමග ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත මෙම අතුරු ව්‍යවස්ථාවේ තෙවැනි උපලේඛනයට සාරානුකූලව ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

8. ආදාහනාගාරයේ ආදාහනය කිරීම සඳහා මෘත ශරීරය භාර ගැනීම සතියේ සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 8.00 දක්වා කාලය තුළ කළ යුතු ය.

9. නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවන්ට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාදවීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය.

10. ආදාහනාගාරයේ ආදාහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ 6 වැනි උපලේඛනයට සාරානුකූලව විස්තර ඇතුළත් කරන ලද ලේඛනයක් ආදාහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. *(අ)* සෑම මෘත දේහයක්ම ආදාහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් එකී මෘත දේහයේ භස්මාවශේෂ භාරගත යුතු ය.

*(ආ)* මෘත දේහය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාරය වෙන් කරවා ගන්නා අවස්ථාවේ මෘත දේහය ආදාහනය කිරීමෙන් පසු භස්මාවශේෂ තැන්පත් කර තැබීම සඳහා මරණකරුගේ නම හා ලිපිනය සඳහන් භාජනයක් (තදින් මූඩිය වැසිය හැකි) මියගිය අයගේ ළඟම ඥාතීන් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබා දිය යුතු ය.

*(ඇ)* ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භස්මාවශේෂ මිය ගිය අයගේ ළඟම ඥාතීන්ට හැර වෙනත් පුද්ගලයන්ට භාර දීමක් සිදු නොකළ යුතු ය.

*(ඈ)* එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා විසින් එකී භස්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

*(ඉ)* *(ආ)* ඡේදය යටතේ භස්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගැනීමට දීර්ඝ කරන කාලය, ආදාහනය සිදු කළ දින සිට සති දෙකකට නොවැඩි විය යුතු ය.

*(ඊ)* එසේ භස්මාවශේෂ ඉවත්කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත් කර නොගත් භස්මාවශේෂ බැහැර කිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ ආදාහනාගාර භාරකරුට බලය තිබිය යුතු ය.

*(උ)* කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් භාර නොගත් භස්මාවශේෂ ආදාහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වළ දැමීමට කටයුතු සැලැස්වීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය.

*(ඌ)* ආදාහනාගාරයෙන් ඉවත් කරනු ලබන භස්මාවශේෂ 11 *(අ)* වැනි වගන්තියේ සඳහන් විධිවිධානයන් අනුව භාර දී ඇති භාජනයකට දමා ප්‍රවේශම් සහිතව තත් කාර්යය සඳහා වෙන් කොට ඇති කොටසෙහි හෝ කුටියෙහි ආදාහනාගාරයෙහි භාරකරු විසින් තැන්පත් කර තැබිය යුතු ය.

12. *(අ)* කිසියම් ආදාහනාගාරයක, දහන කුටීරයට මෘත දේහය ඇතුල්කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන් හැර වෙනත් යම් තැනැත්තෙකු ඇතුල්වීම නොකළ යුතු ය.

*(ආ)* සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් තැනැත්තෙකුට ආදාහනාගාර පරිශ්‍රයකට ඇතුල්වීම නොකළ යුතු ය.

*(ඇ)* *(ආ)* ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ බලයලත් තැනැත්තෙකු සමග එකී අවස්ථාවට සහභාගීවන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් ; සහ

(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භස්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර, අවසර පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තියක් ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල් වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

*(ඈ)* මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන යම් ගැටළුවක දී සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කරනු ලැබුවහොත් හා ඒ සඳහා නිසි බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු

රුපියල් 750.00 ට නොවැඩි දඩයකට යටත් වන්නේ ය. තව ද නොකඩවා එකී වරද සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේ නම් එකී වරද කරනු ලබන සෑම අවස්ථාවක් සඳහා ම දිනකට රුපියල් 250.00 ට නොවැඩි දඩයකට ද එම තැනැත්තා යටත් වන්නේ ය.

13. යම් ආදාහනාගාර පරිශ්‍රයක් තුළ -

(අ) සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,
(ආ) ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලට අලාභහානි කිරීම හෝ එසේ කිරීමට තැත්කිරීම,
(ඇ) ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයකුගේ රාජකාරියට බාධා කිරීම,
(ඈ) ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතු ය.
(ඉ) ආදාහනාගාරය වෙන් කරනු ලබන අයෙකුගෙන් යම් දේපළක් හෝ ගොඩනැගිල්ලක් හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදාහනාගාරය වෙන් කරනු ලබන අය එකඟ විය යුතු ය.

14. (අ) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) යම් ආදාහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීම හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදාහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"දහන කුටීරය" යන්නෙන්, ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරය හා පිටතින් සාදන ලද බාහිර කුටීරය ද,

"ආදාහනාගාර පරිශ්‍රය" යන්නෙන්, සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන්, තත් කාලයේ දී දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු ද,

"භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන්ද,

"මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තකුගේ සම්පූර්ණ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහයකින් කිසියම් කොටසක් ද,

අදහස් විය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල නොගැළපෙන යම් අවස්ථාවක දී සිංහල පිටපත බල පැවැත් වේ.

### *පළමුවැනි උපලේඛනය*

ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු

| | | රු. ශ. |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 6,500 00 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 7,500 00 |

### *දෙවැනි උපලේඛනය*

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය.)

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :—————.
ලිපිනය :—————.
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :—————.
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :—————.

02. මියගිය අයගේ සම්පූර්ණ නම :—————.
ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :—————.
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :—————.
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :—————.

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :———.
(තහවුරු කිරීමට 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න.)

04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :—————.
(මරණ සහතිකයේ පිටපත් අමුණන්න)

05. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :——————.

06. මරණයට හේතුව :—————.

07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, (4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ දැක්වෙන සහතිකය අමුණන්න.)

පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :—————.
පරීක්ෂණය පැවැත් වූ දිනය :—————.
පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :—————.
මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දී තිබේ ද? :—————.

08. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව :—————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතික අමුණා ඇත.

..............................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

***තෙවැනි උපලේඛනය***

.................................මහතා/මහත්මිය/මෙනෙවිය

**මෘත දේහයක් ආදාහනය කිරීමට අවසරපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසු පිටේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුව, අවසරපත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

(i) ..............................................................................................................

(ii) ..............................................................................................................

(iii) ..............................................................................................................

(iv) ..............................................................................................................

........................................................

සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන,

(නිල මුද්‍රාව.)

දිනය :—————.

........................................................

ආදාහනාගාර භාරකරු,

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය.

***හතරවැනි උපලේඛනය***

***මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය***

(01) ................................................. යන අයගේ මෘත දේහය 20...........ක් වූ.....................මස.................දින පෙරවරු/පස්වරු.....................ට ........................... ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසර දෙමි.

පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු මෙම අතුරු ව්‍යවස්ථාවේ 6 වැනි වගන්තියේ ලේඛනයේ සටහන් කරන ලදී.

(02) 20.................. දින, අංක....................දරන ලදුපත මගින් රු........................ක් අයකර ගෙන ඇත.

(03) මෙම අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට ක්‍රියා කරන්න.

(04) අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය........................... වේ.

...................................................................

සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන,

(දින මුද්‍රාව.)

දිනය :—————.

***පස් වන උපලේඛනය***

*දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසරපත්‍ර ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | අවසරපත් ලේඛන හා අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | නම | මරණකරු වෙත ඇති නෑකම |
| 01. | | | | | | | | |
| 02. | | | | | | | | |

| මරණකරුගේ | | | මහෙස්ත්‍රාත් /හදිසි මරණ පරීක්ෂක නියෝගයේ | අවසර පත් අංකය | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන්කළ | |
|---|---|---|---|---|---|---|---|---|
| ලිපිනය | ජා.හැ.ප. අංකය | යොමු අංකය | දිනය | | අංකය | මුදල රු.ශ. | දිනය | වේලාව |
| | | | | | | | | |
| | | | | | | | | |

*හය වන උපලේඛනය*

*දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහය පිළිබඳ ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා.හැ. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනය හා අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | මරණකරුගේ | අවසර පත් අංකය | ලදුපතේ | | ආදාහනය කළ | | භස්මාවශේෂ ගෙන ගිය දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | ජා.හැ. අංකය | | අංකය | මුදල රු.ශ. | දිනය | වේලාව | |
| 01. | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | |

12-27

---

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. මෙම අතුරු ව්‍යවස්ථා දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. *(අ)* දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක -

(i) රථවාහන නවතා තැබීම තහනම් කිරීම;
(ii) සීමා කිරීම;
(iii) එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
(iv) බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
(v) මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
(vi) බස් නැවතුම් ස්ථාන නම් කිරීම;
(vii) තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිශාව තීරණය කිරීම.

සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් *02 (අ)* ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාළ ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක 444/18 දරන 1 වන කොටස (1) වන ඡේදය *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව විය යුතුවාක් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

3. දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියැදුරෙකු විසින් 2 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

4. 3 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණද 2 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් -

(අ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා ;

එකී 3 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

5. (අ) දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, මෙහි මින් මතු "රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා -

(i) දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක්; හෝ

(ii) වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක් හෝ වෙන් කිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය හා එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණද යන්න කලින් කල තීරණය කිරීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය හැකි ය.

(ඇ) 5 වන වගන්තියේ සඳහන් වන්නා වූ සෑම රථ ගාලක්ම වාර්ෂිකව ප්‍රාදේශීය සභාව විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත්කළ යුතු වන්නේ ය.

6. සෑම රථ ගාලක ම අවම වශයෙන් වාහන ඇතුල් කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද, බැගින් දොරටු දෙකක් වෙන් කර තිබිය යුතු ය. එසේ වුව ද රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තිබෙන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළ හැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකි ය.

7. සෑම රථ ගාලක ම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයෙන් භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේ දී සහ ඉන් පිටතට ගැනීමේ දී ධාවනය කළ යුතු දිශාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටි මීටර් 20ක පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

8. (i) සෑම රථ ගාලකම බිම රථවාහන නවතා තැබීම සඳහා යෝග්‍ය පරිදි (තාර, කොන්ක්‍රීට් හෝ බිම ඇතිරීම සඳහා යොදා ගනු ලබන වෙනත් ඕනෑම ද්‍රව්‍යයක්) සකස් කර තිබිය යුතු අතර වර්ෂා අවස්ථාවල දී එම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් බැහැරට ගලා යාමට සුදුසු පරිදි සකස් කර තිබිය යුතු ය.

(ii) හැකි සෑම අවස්ථාවකම රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයට වෙන් වෙන් වූ වැසිකිළි පහසුකම් සැලසීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

9. හැකි සෑම අවස්ථාවකම එකී වෙන් කිරීම් කිරීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

10. සෑම රථගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මං තීරු ඇතිකර තිබිය යුතු ය.

11. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී , ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩ කඩ වෙන් කර තිබිය යුතු අතර එක් එක් වාහනය සඳහා වෙන් කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටි මීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

12. කිසියම් රථ ගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අය කළ හැකි ය. එසේම කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අයකිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

13. (අ) කිසියම් රථ ගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින් මතු "රථ ගාල භාරකරු" යනුවෙන් හඳුන්වනු ලබන —

(i) දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු ; හෝ

(ii) දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවෙකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු ;

යෙදවීම කළ හැකි ය.

(ආ) එසේ වුව ද, කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 3 වන උපලේඛනයේ සඳහන් ආකාරයට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාක් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

14. සෑම රථ ගාල භාරකරුවෙකු ම ඒ කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන

හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

15. (අ) 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුල් කරන අවස්ථාවේ දී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟ දී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ පළමු උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දැක්වෙන ඇතුල්වීමේ අවසර පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

(ආ) ඇතුල්වීමේ අවසර පත්‍රයක් සහිත සෑම වාහනයක් ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර -

(i) (අ) ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථ ගාල භාරකරුට ආපසු භාරදීම;

(ii) 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම ; සහ

(iii) ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 13 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබා ගැනීම එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

(ඇ) රථ ගාල පාවිච්චි කරනු ලබන නිත්‍ය කුලී රථ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනය ප්‍රකාර කුවිතාන්සිය වෙනුවට 2 වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අවසර පත්‍රයක් සභාව මගින් 3 වැනි උපලේඛනය ප්‍රකාරව නියම කර ඇති ගාස්තුවක් ගෙවා ලබාගත යුතු අතර එකී අවසර පත්‍රය පිටතට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය වන පරිදි අලවා තැබිය යුතු ය.

(ඉ) මෙම කොටසේ 1 වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසර පත්‍රයක් නිකුත් කිරීම රථවාහන පාලකගේ කාර්යය වන්නේ ය.

16. (අ) කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩ දීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථ ගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

(ආ) රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පන ගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල්කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනයකට (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද එකී වාහනය ඇදගෙන යාමේ දී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

17. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක් ඇතුළත -

(අ) වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම;

(ආ) යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පන ගැන්වීමට අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අළුත්වැඩියාවක් කිරීම;

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කිසියම් අළුත්වැඩියා කිරීමක දී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අත්‍යාවශ්‍ය වන්නාවූ හෝ බාධාකාරී වන්නාවූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;

(ඈ) එකී රථගාලේ ධාවන මංතීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වනලෙස වාහන නවතා තැබීම;

(ඉ) අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;

(ඊ) මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කල කෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම ; හෝ

නොකළ යුතු ය.

18. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාක් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව හෝ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

19. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ් පත පරීක්‍ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක එය පරීක්‍ෂා කිරීම සඳහා ලබාදීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියැදුරුගේ කාර්යය විය යුතු ය.

20. 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහනය ධාවනය කළ යුතු දිශාව පෙන්වන සලකුණු කර ඇති දිශාවට පටහැනි දිශාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

21. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

22. කිසියම් රථ ගාලක ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවත් කිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"මාර්ගය" යන්නෙන්, දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක්, ඒදණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපණයට ගැලපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතු ය.

24. මෙම අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ සෑම හෝ ඕනෑම නීතියක් කඩකිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියෙන් නියම කර ඇති දඩයකට යටත් වන අතර එසේ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය පිළිබඳ අවධානය යොමු කරමින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ බලය ලත් ඕනෑම නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ පසුව ද, උල්ලංඝනය තව දුරටත් නොකඩවා සිදු කරගෙන යන්නේ නම් එවැනි අවස්ථාවක දී දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියේ එවැනි කඩ කිරීමක් සම්බන්ධයෙන් වූ අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත් වල අර්ථය සම්බන්ධයෙන් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගු වන්නේ ය.

### පළමුවන උපලේඛනය

*13 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය*

| *දෙහිඕවිට ප්‍රාදේශීය සභාව*<br>*.................................. රථ ගාල*<br>*වාහන නවතා තැබීමේ ගාස්තු* | *දෙහිඕවිට ප්‍රාදේශීය සභාව*<br>*.................................. රථ ගාල*<br>*වාහන නවතා තැබීමේ ගාස්තු* | |
|---|---|---|
| වාහනයේ අංකය :.............<br>දිනය :.............<br>පැමිණි වේලාව :.............<br>පිටවූ වේලාව :.............<br>අයකළ ගාස්තුව :.............<br><br>.........................................................<br>රථ වාහන පාලකගේ අත්සන. | වාහනයේ අංකය :.............<br>දිනය :.............<br>පැමිණි වේලාව :.............<br>පිටවූ වේලාව :............. | මුදල රු.......................... |

### දෙවැනි උපලේඛනය

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

*වාහන නවතා තැබීමේ අවසර පත්‍රය*

අවසර පත්‍ර අංකය -

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපති ...................... වන මා විසින් ................ රථ ගාලේ .................. දින සිට .................. දින දක්වා.................... අංක දරන වාහනය ගාල් කිරීම සඳහා එහි අයිතිකරු වන................. මයා ට මෙම අවසර පත්‍රය නිකුත් කරනු ලැබේ.

..............................
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඕවිට.

### තුන්වැනි උපලේඛනය

**අයකළ යුතු ගාස්තු ප්‍රමාණය**

01. ත්‍රිරෝද රථයක් රථගාල අඛණ්ඩව පාවිච්චි කරන අවස්ථාවක මාසික හෝ වාර්ෂික ගාස්තුවක් ගෙවිය හැක.

වාර්ෂිකව - රු. 1,000
මාසිකව - රු. 150

02. වෑන් රථ, බස් රථ, ලොරි රථ, ටිපර් රථ, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර්, ට්‍රේලර් සහිත වෙනත් වාහන අඛණ්ඩ රථගාල පාවිච්චි කරන අවස්ථාවක මාසික හෝ වාර්ෂිකව ගාස්තුවක් ගෙවිය හැකි ය.

වාර්ෂිකව - රු. 1,500
මාසිකව - රු. 200

03. අඛණ්ඩ රථගාල පාවිච්චි නොකරන, රථ ගාලෙහි නතර කරනු ලබන රථ වාහන සඳහා පනවන ගාස්තුව-

| | |
|---|---|
| යතුරු පැදි සඳහා | රු. 10 0 |
| ත්‍රිරෝද රථ සඳහා | රු. 20 0 |
| කාර්, වෑන්, ජීප්, කැබ්රථ හා මෝටර් රිය සඳහා | රු. 40 0 |
| බස් රථ (ලංගම හැර), ලොරි රථ, ට්‍රිපර් රථ, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර්, ට්‍රේලර් සහිත වෙනත් වාහන සඳහා | රු. 50 0 |
| ඉහත සඳහන් වාහන හැර වෙනත් වාහන සඳහා | රු. 60 0 |

වාහන නතර කර තබන පළමු පැය සඳහා ඉහත සඳහන් ගාස්තුව ද වැඩි වන සෑම පැයක් සඳහා රු. 10 බැගින් ද අය කළ යුතු ය.

**කුලියට ධාවනය කරනු ලබන ත්‍රිරෝද රථ නවතා තබන ස්ථාන**

දෙහිඕවිට රථ ගාල
තල්දූව - අම්තිරිගල පාර ආරම්භයේ
තල්දූව කෑගල්ල පාරේ විද්‍යාල මාවත අසල සිට කොලොන්න සර්විස් සෙන්ටර් දක්වා
(අවිස්සාවේල්ල දෙසට පාරේ වම් පස)
ඉහල තල්දූව මඤ්ඤොක්කා ගහයට කඩේ හන්දිය
තිඹිරිපොල - පිටදෙනිය හන්දිය
අටුලුගම හන්දිය
දෙබෑගම හන්දිය
කනංගම - අටුලුගම හන්දිය
කනංගම නගරය
දැරනියගල පාරේ උඩබාගේ හන්දිය
දැරනියගල පාරේ දිගල හන්දිය
දැරනියගල පාරේ දෙල්ඔලුව හන්දිය
දැරනියගල පාරේ දංගම්පල හන්දිය
දැරනියගල පාරේ සියඹලාගහ හන්දිය
ගුරුගල්ල හන්දිය
ගුරුගල්ල - වැලිපිටිය හන්දිය
නාපාවල හන්දිය
යෝගම හන්දිය
මුරුත්තෙට්ටුව හන්දිය
බටංගල හන්දිය
කම්බිඅඩිය හන්දිය
පනාවල හන්දිය
බදුවත්ත හන්දිය
අම්බලම්පිටිය හන්දිය
ගොඩගම්පල හන්දිය
රංගේගම හන්දිය
බෝමලුව හන්දිය
වෙලන්ගල්ල හන්දිය
නිකවලමුල්ල වැල් පාලම අසල
දෙහිඕවිට - ඇහැලියගොඩ පාරේ ඉන්ධන පිරවුම්හල අසල
කහනාවිට ඇල්ල අසල

12-28

---

**සති පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සතිපොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය සඳහා වන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ :-

2. සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් සතිපොළක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු ය :-

(i) සතිපොළේ ගොඩනැගිලි සියල්ලම ගඩොලින් හෝ ගල්වලින් ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් හෝ ස්ථිරව ඉදිකර තිබිය යුතු අතර, සෑම සති පොළ ගොඩනැගිල්ලකම බිමට කොන්ක්‍රීට් යොදා පොළව මට්ටමේ සිට අවමය අඩි එකක පමණ උසින් සිටින සේ ගෙබිම ඉදිකර තිබිය යුතු ය ;

(ii) වහලය කිසියම් ස්ථිර සෙවිලි ද්‍රව්‍යයකින් තනා නිමකර තිබිය යුතු ය ;

(iii) ගොඩනැගිල්ල ඇතුළත වෙළෙඳ කඩ කාමර පේළි දෙකක් අතර අවම පරතරය මීටර් 2ක් පළලින් සමන්විත විය යුතු අතර, එය වේදිකාව පාරිභෝගිකයින්ගේ ගමනාගමනයට උචිත පරිදි ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතු අතර, වැසි ජලය මගී ගමනාගමනයට බාධා නොවන ආකාරයට බැස යාමට සලස්වා තිබිය යුතු ය ;

(iv) සතිපොළ ඇතුළත ඉදි කරනු ලබන සෑම වෙළෙඳ මැස්සක්ම ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් ඉදිකළ බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් නිමකළ තට්ටුවකින් යුක්ත විය යුතු ය. කෙසේ වුව ද කොන්ක්‍රීට් තහඩුවකින් තට්ටුව නිමකර ඇති විට එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළෙඳ මැහි තැනීමට නොහැකි වන යම් අවස්ථාවක පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර, එකී කොටස් ගඩොලින්, සිමෙන්ති ගලින් හෝ කබුක් ගලෙන් නිම කර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර, එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සලකුණු සුදු පාටින් ලකුණු කර තිබිය යුතු ය ;

(v) සෑම වහලයක ම වැහි පිහිලි යොදා තිබිය යුතු අතර, වැහි පිහිලිවල රැස්වන ජලය පහළට බැසයාමට ප්‍රමාණවත් බට සවිකර තිබිය යුතු ය ;

(vi) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම්, එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය ;

(vii) ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම හා ආබාධිත පුරවැසියන් සඳහා විශේෂ පහසුකම් සහිත වෙන වෙනම සැකසූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, එකී සෑම වැසිකිළියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 01 ක් උසට බිත්ති පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(viii) සතිපොළ ගොඩනැගිලි දෙකක් අතර පාරිභෝගිකයන් ගමන් කරන පදික කොටස් අව්වෙන් වැස්සෙන් ආවරණය වන පරිදි සකසා තිබිය යුතු අතර, වහලයෙන් වැස්සෙන ජලය විධිමත්ව සකස්කළ කාණු පද්ධතියකට ගලායාමට සකස්කර තිබිය යුතු යි ;

(ix) සතිපොළ පරිශ්‍රය තුළ සභාව විසින් අනුමත කළ සැලැස්මකට අනුව ආපනශාලාවක් හෝ තේ, කෝපි කඩයක් ඉදිකර පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේ ය ;

(x) සතිපොළ සෑම වෙළෙඳ ස්ථානයකටම අවශ්‍යතාව අනුව භාවිතා කිරීම සඳහා විදුලි සැපයුමක් ලබාදීම සභාවේ කාර්යය වන්නේ ය ;

(xi) සතිපොළ පරිශ්‍රය තුළ ආගමික කාර්යයන් ඉටුකිරීම සඳහා පහසුකම් සලසාදීම සභාවේ කාර්යය වන්නේ ය.

(xii) පරිශ්‍රය ඇතුළත පොදු ජල කරාම සවිකර තිබිය යුතු ය.;

(xiii) එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙනම ස්ථානයක් වෙන්කර තිබිය යුතු අතර, පොදු වැසිකිලිවල ඇති ජල කරාම හා පානීය ජලය සඳහා සවිකර ඇති ජල කරාම ඉහත සඳහන් කළ කාර්යයන් සඳහා භාවිත නොකළ යුතු ය. ;

(xiv) සතිපොළ පරිශ්‍රය ඇතුළට එක එල්ලේ හා වහලය මතට පතිතවන වර්ෂා ජලය හා එළවළු හා පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය නිසි ආකාරයෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර, එකී අප ජලය බාධාවකින් තොරව ගලා යාමට සලස්වා තිබිය යුතු ය. ;

(xv) සති පොළෙහි වෙළෙඳ ස්ථානවල පිහිටීම සැලකිල්ලට ගනිමින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් මස්, මාළු, කරවල, එළවළු, පළතුරු, සිල්ලර බඩු හා වෙනත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම සඳහා සති පොළ කොටස්වලට බෙදා වෙන් කිරීම ද නාමිකව ප්‍රදර්ශනය කිරීම ද, දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය ;

(xvi) පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය -

(අ) ජෛවහායන අපද්‍රව්‍ය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම් ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස් ;
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය,

වෙන වෙනම රැස්කළ හැකි බක්කි හෝ භාජන හෝ ටැංකි හෝ එකී පොළෙහි වෙනම ස්ථානයක තබා තිබිය යුතු අතර, ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජනය හෝ ටැංකිය මීයන්ට, මැස්සන්ට, වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියකුට ඇතුල්වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබීම හෝ පරිශ්‍රයේ ජනනය වන කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමයක් සකසා තිබිය යුතු යි.

3. (i) සති පොළෙහි ඇති කිසියම් වෙළෙඳ ස්ථානයක භාණ්ඩ විකුණනු ලබන තැනැත්තන් හෝ සතිපොල පරිශ්‍රය තුළ ජංගම වෙළෙඳාම සඳහා ටිකට් පතක් ලබාගෙන ඇති කිසියම් තැනැත්තෙකු විසින් වෙළෙඳ පරිශ්‍රය හෝ ඒ අසළ හෝ වෙළෙඳ මැස්ස මත හෝ ඒ අසළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය-

(අ) ජෛවහායන අපද්‍රව්‍ය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(ඈ) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම් ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස් ;
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ගකර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තනා ඇති වෙන් වෙන් වූ බක්කිවලට හෝ භාජනවලට හෝ ටැංකිවලට දැමීම හෝ සභාව විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රමවේදයට අනුව අපද්‍රව්‍ය බැහැර කිරීම එකී තැනැත්තන්ගේ කාර්යය විය යුතු ය.

(ii) සති පොළෙහි තබා ඇති අපද්‍රව්‍ය රැස්කරන කවර හෝ භාජනයක, බක්කියක හෝ ටැංකියක බහාලීමට වෙන්කළ වර්ගයේ අපද්‍රව්‍ය හැර වෙනත් වර්ගයක අපද්‍රව්‍ය එකී භාජනයට, බක්කියට හෝ ටැංකියට දැමීම කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය ;

(iii) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (xvi) වැනි ඡේදයේ නියමයන් යටතේ ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්නා අවස්ථාවේ දී හැර වෙනත් සෑම අවස්ථාවකදී ම එකී බක්කියේ හෝ භාජනයේ හෝ ටැංකියේ පියන හොඳින් වසා තැබීම කළ යුතු ය ;

4. (i) කවර හෝ සති පොළක වෙළෙඳාම සඳහා වෙන්කළ ඉඩ ප්‍රමාණය යන්නෙන් සභාව විසින් නිශ්චිතව සලකුණු කරන ලද සීමාවන් අදහස් වේ ;

(ii) විකිණීම සඳහා සති පොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළෙඳාම සඳහා යොදාගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාණ්ඩ පොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරට ගෙනයනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී ඉහත 04.1 හි සඳහන් කරන ලද වෙළෙඳාම සඳහා වෙන්කර ඇති සීමාවෙන් පිටත තැබීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(iii) සති පොළ ඇතුළත සීමා සලකුණු කර වෙළෙඳ කටයුතු සඳහා අවසර දී ඇති පරිශ්‍රය තුළ හා ජංගම වෙළඳාමේ නිරත වීම සඳහා අවසර ලබා දී ඇති ස්ථානවල හැර වෙනත් කවර ස්ථානයක හෝ වෙළෙඳාම නොකළ යුතු අතර පදික කොටස්වල ගමන් කරනු ලබන තැනැත්තන්ට බාධාවන ආකාරයේ කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

5. 2. ix වගන්තියේ සඳහන් ස්ථානයක හැර සතිපොළ පරිශ්‍රය තුළ වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

6. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු කිසියම් සති පොළක -

(i) ඇතුළත අසංවරව හැසිරීම හෝ කල කෝලාහල කිරීම හෝ මත්ද්‍රව්‍ය, මත්පැන් පානය කර හැසිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම ;

(ii) දෛනික කටයුතු අවසානයේ සති පොළ වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුළත රැඳී සිටීම ;

(iii) කිසියම් ගොඩනැගිල්ලකට, ඉදි කිරීමකට හෝ සවි කිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යයකට හෝ හානි කිරීම හෝ අලාභ කිරීම හෝ විකෘති කිරීම හෝ විරූපි කිරීම ;

(iv) පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ අපතේ යාමට ඉඩ හැරීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම හෝ එකී ජලයෙන් ස්නානය කිරීම හෝ රෙදි හෝ සතුන් සේදීම සහ එළවළු සහ පළතුරු සේදීමට වෙන්කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම.

(v) විදුලිය සම්බන්ධතාව ලබාදී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසළට ළඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම,

(vi) ජල සම්බන්ධතාව ලබාදීම සඳහා ගොඩනැගිල්ල තුළ එළා ඇති ප්‍රධාන ජල නලයෙන් හෝ වෙනත් කිසියම් ජල නළයකින් වංචනිකව ජල සම්බන්ධතාවක් ලබා ගැනීම,

(vii) තත් කාර්යය සඳහා වෙන්කළ ස්ථානයක හැර කවර හෝ වර්ගයක එළවළු, මස් හෝ මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම,

(viii) සති පොළ පරිශ්‍රය තුළ සකස් කර ඇති වාහන නැවතුම් ස්ථාන හැර වෙනත් ස්ථානවලට පාපැදි හෝ යතුරු පැදි හෝ මෝටර් වාහන රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩදීම, කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7\. (i) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස සති පොළෙහි කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්තවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

8\. සති පොළ පරිශ්‍රය සතිපොළ පැවැත්වෙන දිනට පෙර දින සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමටත්, සති පොළ පැවැත්වෙන දිනය අවසානයේ දී නැවත වතාවක් සම්පූර්ණයෙන් ම පිරිසිදු කිරීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

9\. සති පොළෙහි එළවළු, පළතුරු, මස්, මාළු, කරවල හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම කරනු ලබන තැනැත්තන් විසින් අදාල සතිපොළ පැවැත්වෙන දිනය අවසානයේ දී තමන් වෙළෙඳාමේ නියුක්ත වෙළෙඳ පරිශ්‍රය හෝ මැස්ස අවස්ථාවෝචිත පරිදි සෝදා හෝ සූරා පිරිසිදු කිරීම කළ යුතු ය.

10\. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් වෙළෙඳපොළ පරිශ්‍රය වෙන්කර දී ඇත්තේ කිනම් වර්ගයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාමක් සඳහා ද, එසේ වෙන් කරන ලද වර්ගයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ ආකාරයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

11\. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතකාගාරයකදී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස සති පොළෙහි මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

12\. කවර හෝ ගෝ ඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ 17 වැනි වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, සති පොළ ඇතුළත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළඳාම් කිරීම පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

13\. කවර හෝ තැනැත්තෙකු විසින් සති පොළ පරිශ්‍රය ඇතුළට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර ගෝ සතෙකු හෝ පක්ෂියෙකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකළ යුතු ය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයක් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු සති පොළ ඇතුළට රැගෙන එනු ලැබීම වළක්වන නියමයක් ලෙස තේරුම් නොගත යුතු ය.

14\. සති පොලෙහි වෙළෙඳාම් අවසන් කර සති වෙළඳපොළ සම්පූර්ණයෙන් ම වසා තබන අවස්ථාවක සහ සති පොළෙහි කිසියම් වෙළෙඳ මැස්සක් වසා දමා බැහැරට යන සෑම අවස්ථාවක දී ම එකී වෙළඳ පරිශ්‍රයේ සියලුම විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රිය කර දැමීම කළ යුතු ය.

15\. 2xi වගන්තියෙන් පහසුකම් සලසා ඇති ස්ථානයේ හැර සතිපොල පරිශ්‍රය තුළ වෙනත් කුමන හෝ ස්ථානයක ආගමික කාර්යයන් උදෙසා පහන් ඉටිපන්දම් ආදිය දැල්වීම නොකළ යුතු ය.

16\. සති පොළෙහි ඇති සෑම වැසිකිළියක් හා කැසිකිළියක් ම සති පොළ පැවැත්වෙන සෑම දිනයක දී ම අවම වශයෙන් දිනකට තුන් වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත් ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම සතිපොල පැවැත්වෙන දිනයේ දී දිනකට දෙවතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

17\. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (xvi) වැනි ඡේදයේ නියමකර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක, භාජනයක හෝ ටැංකියකම රැස්කරනු ලබන අපද්‍රව්‍ය, සති පොළ පැවැත්වෙන දිනයේ දී අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

18\. සති පොළෙහි කිසියම් වෙළඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 23 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත් ලබා ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී අවසර පත්‍රය අන්සතු කිරීම හෝ එකී අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළෙඳ පරිශ්‍රයක්/වෙළඳ මැස්සක් සඳහා ද, එකී වෙළඳ ස්ථානයක් නොවන වෙනත් කිසියම් ස්ථානයක වෙළඳාම් කිරීම හෝ නොකළ යුතු අතර, කවර හෝ තැනැත්තෙකු එසේ ක්‍රියා කර තිබෙන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති අවස්ථාවක ඔහු නියමිත ස්ථානයේ වෙළඳාම් සඳහා යොමු කිරීමට නැතහොත්

එකී දිනයේ වෙළඳාම් කටයුතුවලින් වළක්වා සති පොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

19. කිසියම් සති පොළක වෙළෙඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ලබා ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් ස්ථාන නිර්ණය කිරීම සම්බන්ධයෙන් සභාව සමග ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව තමාගේ වෙළෙඳ කාර්යය සඳහා වෙන්කර ගත් එකී වෙළෙඳ ස්ථානයේ ඉඩකඩ නැතහොත් ඉන් කිසියම් කොටසක්, කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමට හෝ වෙළඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩදීම නොකළ යුතු ය.

20. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කලින් තීරණය කර තත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කිසියම් වෙළෙඳ පරිශ්‍රයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

21. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක් විවෘතව තැබිය යුතු දිනයන් සහ වේලාවන් කලින් කල දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට සති පොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන් ම වූ දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් සති පොළට ඇතුල්වීමේ දොරටුව අසළ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

22. සතිපොළ වෙළෙඳ ස්ථානවල වෙළෙඳාමේ නිරත වන ඕනෑම තැනැත්තෙක් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මගින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ අවසර පත්‍රයක් ලබාගෙන ඇත්තේ නම් මිස, කිසිදු වෙළෙඳ කාර්යයක නිරත නොවිය යුතු ය. එකී ගාස්තු ප්‍රමාණයන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

23. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතිපොළ වෙළෙඳ පරිශ්‍රයන් වෙන් කර දීම සඳහා අත්සන් කර ඇති ස්ථාන නිර්ණය කිරීම සඳහා වූ ගිවිසුම් පත්‍රයේ නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල වන්නේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් සතිපොළේ වෙළෙඳ පරිශ්‍රයන් පාවිච්චි කිරීම හෝ පරිහරණය නොකළ යුතු ය.

24. සතිපොළෙහි වෙළෙඳ කාර්යයේ නිරත වන ඕනෑම තැනැත්තෙක් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග දෙවන උපලේඛනයේ ප්‍රකාර වාර්ෂිකව අත්සන් කරනු ලබන වෙළෙඳ පරිශ්‍ර සඳහා වූ ඉඩකඩ වෙන්කිරීමේ (ස්ථාන නිර්ණය කිරීමේ) ගිවිසුම් පත්‍රයකට අත්සන් තැබිය යුතු අතර, ගිවිසුමේ සඳහන් කොන්දේසීන්ට හා නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

25. 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණේ වුව ද, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනය වනවිට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතුව තිබෙන කිසියම් සති පොළක එක් එක් වෙළෙඳ පරිශ්‍ර සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග අවසන් වරට අත්සන් කරන ලද සතිපොළ ස්ථාන නිර්ණය කිරීමේ ගිවිසුමේ සඳහන්, වෙළෙඳ කාර්යයේ නිරත වන පුද්ගලයෙකු එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන දිනයේ සිට 24 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ එකී වෙළෙඳ පරිශ්‍රය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරාගනු ලැබූ වෙළෙඳ කාර්යයේ නිරත වන්නකු වශයෙන් සැලකීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ තවදුරටත් මේ අතුරු ව්‍යවස්ථාව අදාළ වන කවර හෝ වෙළෙඳ කාර්යයේ නිරතවන්නකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත 24 වැනි වගන්තියේ සඳහන් නියමයන්ට අනුව නව ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

26. (i) 24 සහ 25 වැනි අතුරු ව්‍යවස්ථා නියමයන් යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක් එක් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, එකී වර්ෂයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග අළුත් ගිවිසුමකට එළැඹීමෙන් පසුව තවත් එක් වර්ෂයක කාලයක් සඳහා එකී සතිපොළ වෙළෙඳ පරිශ්‍රයන් වෙන්කර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ ආකාරයෙන් ම යම් අනුගාමී වර්ෂයක් සඳහා එකී වෙළෙඳ පරිශ්‍රයේ ගිවිසුමක කාලය වාර්ෂිකව වලංගු කරවාගෙන එකී වෙළෙඳ ස්ථානය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට එකී ගිවිසුම්කරුට හිමිකම තිබිය යුතු ය.

(ii) කෙසේ වුව ද 26(i) ඡේදය යටතේ කිසියම් ගිවිසුම්කරුවෙකු විසින් අනුගාමී වර්ෂය සඳහා ගිවිසුම්ගත කාලය වලංගු කරවාගෙන එකී වෙළෙඳ පරිශ්‍රය පාවිච්චි කරන හෝ පරිහරණය කිරීම සඳහා එකී අනුගාමී වර්ෂය තුළ ගෙවිය යුතු දෛනික අවසර පත්‍ර ගාස්තුව මෙම අතුරු ව්‍යවස්ථාවේ තුන්වැනි උපලේඛනයට සාරානුකූල විය යුතු ය.

27. කිසියම් වෙළෙඳ පරිශ්‍රයක ගිවිසුම් කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගත වීමට මත්තෙන් 30 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරි වර්ෂය සඳහා ගිවිසුම් කාලය වලංගු කරවාගෙන ඇත්තේ නම් මිස කවර හෝ ගිවිසුම්කරුවෙකුට, පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී වෙළෙඳ පරිශ්‍රය එකී මාසය අවසන් වන දිනෙන් පසුව පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

28. සති පොළෙහි කිසියම් වෙළෙඳ පරිශ්‍ර වෙන්කර දීමේ ගිවිසුම් පත්‍රයට අනුව වෙළෙඳ පරිශ්‍රය වෙන් කර ගෙන ඇති ගිවිසුම්කරු හැර වෙනත් කිසිවෙකු වෙළඳාම් කටයුතුවල නිරත වීම නීත්‍යානුකූල නොවන අතර, එම ස්ථානයේ වෙනත් අයෙකු වෙළෙඳාම් කටයුතුවල නිරත කිරීමක් සිදු කර ඇති බව අනාවරණය වීම මත ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් හා එකී වෙළෙඳ පරිශ්‍රය ආපසු දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම හේතුවෙන් එකී ගිවිසුම්කරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී ගිවිසුම්කරු වෙත ම පැවරෙන අතර දෙහිඕවිට ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ ඒ පිළිබඳව වගකීමට යටත් නොවනු ඇත.

29. සතිපොළ වෙළෙඳ පරිශ්‍රයන් වෙන් කිරීම සඳහා ගිවිසුම්ගත වීමේ දී දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගිවිසුම්කරු විසින් එකවර ගෙවිය යුතු මුදලක් අයකර ගිවිසුම්ගතවීම නීත්‍යානුකූල වන්නේ ය.

30. (i) සති පොළෙහි කිසියම් වෙළෙඳ ස්ථානයක් සඳහා ගිවිසුම්කරු විසින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් දිනයේ උපලේඛන අංක 02හි සඳහන් අවසර පත්‍ර ගාස්තුව ගෙවිය යුතු අතර එවැනි අවසරපත්‍ර

ගාස්තුවක් ගෙවන ලෙස ආදායම් පරිපාලක හෝ සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් ඕනෑම නිලධාරියෙකු ඉල්ලා සිටින අවස්ථාවක දී ගෙවීමකින් තොරව වෙළෙඳ කාර්යයේ නිරත වන ඕනෑම පුද්ගලයෙක් අනවසරයෙන් වෙළෙඳ කටයුතු වල නිරත වන්නෙකු සේ සලකා වෙළඳ පරිශ්‍රයෙන් බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) සතිපොළ පැවත්වෙන යම් දිනයක දී ප්‍රථම වතාවට පැමිණෙන වෙළෙන්දෙකුට ගිවිසුම්ගතවීමකින් තොරව එදිනට පමණක් අවසර පත්‍රයක් ලබාගෙන වෙළෙඳ පරිශ්‍රයක් භාවිතා කිරීමට හැකිවන අතර පසුව එළඹෙන පළමු සතිපොළ දිනය වන විට නීත්‍යානුකූල වෙළෙඳ පරිශ්‍රයක් වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු ය.

(iii) 30 (i) වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලය ලත් සේවකයින් අතර හෝ ඔවුන් මහජනයා අතර වෙළෙඳ පොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන යම් ආරවුලක් සභාපති විසින් හෝ සභාපති විසින් බලය පවරනු ලැබූ පොළ භූමි තුළ රාජකාරියෙහි යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් නිරවුල් කළ හැක.

(iv) පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීම සභාව විසින් පත්කරනු ලබන සහ පොළ පිහිටි භූමිය තුළ රාජකාරියේ යෙදී සිටින නිලධාරියෙකු හෝ නිලධාරීන් විසින් කළ යුතු ය.

(v) බඩු මිලදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින් ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිළධාරියෙකු විසින් කිසියම් ආරවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතු ය.

(vi) පොළ පිහිටි භූමිය ඇතුළත විකිණීම සඳහා ප්‍රදර්ශනය කොට ඇති යම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බව තමාට පෙනී ගියහොත් සභාපති විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(vii) VI ඡේදය යටතේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් ආහාරයට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුව හොත් ඒ ද්‍රව්‍ය තහනම් කිරීමේ දී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කළ හැකි යි.

(viii) සභාපතිවරයාගේ අවසරය ලියවිල්ලකින් ලබානොගෙන තමන්ට දී ඇති වෙළඳ ස්ථානයේ ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ යම් කොටසක් කොටු කිරීම හෝ යම් තීරයක් ඇදීම හෝ වහලක් ඉදිකිරීම නැතහොත් යම් තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීම ඒ වෙළඳ ස්ථානයේ, ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ නොකළ යුතු ය.

(ix) සභාවට අයත් දේපලක් නොවන කිසිම පෙට්ටියක්, මේසයක් පුටුවක් හෝ එවැනි භාණ්ඩයක් සභාපතිවරයාගේ අවසරය නොමැතිව තමාගේ වෙළෙඳ ස්ථානයට ආසන්නයේ හෝ වෙළෙඳ ස්ථානයට ගෙන ඒම හෝ එහි තබා ගැනීම මෙන්ම ඒ වෙළෙඳ ස්ථානයේ හෝ වෙළෙඳ ස්ථානය ආසන්නයේ යම් මඩු සෑදීම හෝ වෙනත් උපකරණ සවිකිරීම නොකළ යුතු ය.

31. සති පොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ වෙළෙඳ ස්ථානයකට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබාගැනීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

32. සති පොළෙහි වෙළෙඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට අවසර පත්‍ර නිකුත් කිරීමට හා එකී අවසර පත්‍ර සඳහා මුදල් අය කිරීමටත් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකි ය. එසේම යම් බලයලත් නිලධාරියෙකු විසින් අවසර පත්‍රය නිකුත් කිරීමෙන් දිනපතා එකතු කරනු ලබන මුදල් එදින පස්වරු 3.00 පැයට පෙර දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීමට සැලැස්වීම එකී බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. කිසියම් දිනයක එකී බලයලත් නිලධාරියා විසින් එකතු කරනු ලැබූ මුදල් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ අරමුදලට බැර කිරීමට නොහැකි වුවහොත් සති පොළෙහි අවසර පත්‍ර නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම් එය අනුගාමී වැඩ කරන දිනයේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

33. සති පොළෙහි කඩ කාමර සහ වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට අවසර පත් නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම, 32 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යෙදවීමට නොහැකි වන්නේ නම්, එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලබන (මෙහි මින් මතු "ගාස්තු අය කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තෙකුට පැවරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

34. 33 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගත යුතු ය. එසේ වුව ද කලින් වර්ෂය සඳහා තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීමටත් සහ එකී ටෙන්ඩර් අයදුම්පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ගාස්තු එකතු කරන්නා වශයෙන් තෝරා ගැනීමටත් මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

35. (i) 33 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගනු ලැබූ විට ඔහු විසින් -

(අ) එකී තෝරාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවන හා ආපසු නොගෙවන ඇප තැන්පත් මුදලක් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමට,

(ආ) එකී අවසර පත්‍ර නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග ගිවිසුමකට එළැඹීමට,

(ඇ) (ආ) වැනි ඡේදයේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති මාසික කුලී මුදල මෙන් 03 ගුණයක මුදලක් ආරක්ෂක ඇපතැන්පතුවක් ලෙස සභාවේ තැන්පත් කිරීමට ක්‍රියා කළ යුතු යි. තුනෙන් එකකට සමාන හෝ ඊට වැඩි තැන්පත් මුදලක් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමට,

ක්‍රියා කළ යුතු ය.

(ඇ) 35 i ඡේදයේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකුට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක වෙළඳ ස්ථාන පාවිච්චි කරන තැනැත්තන්ට අවසර පත් නිකුත් කිරීමට හා ඒ අවසරපත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට ඉඩ දීම නොකළ යුතු ය.

36. 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ කිසියම් සති පොළක වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ඉක්ම වූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීම කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් නොකළ යුතු ය.

37. 35 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) ඡේදයේ (ආ) වැනි අනුඡේදයේ නියමයට අනුව කිසියම් ගාස්තු එකතු කරන්නකු සමග දෙහිඕවිට ප්‍රාදේශීය සභාව අත්සන් කරනු ලබන ගිවිසුමෙහි -

(i) වෙළඳ ස්ථාන පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කළ යුතු ආකාරය,

(ii) එකී අවසර පත්‍ර සඳහා මුදල් අයකරන ආකාරය සහ අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය,

(iii) ගාස්තු එකතු කරන්නා විසින්, ගිවිසගන්නා වර්ෂය වෙනුවෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල,

(iv) එකී වාර්ෂික මුදල සමාන වාරික දොළහකින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව සහ එක වාරිකයක වටිනාකම,

(v) එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු දිනය,

(vi) නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී මුදලේ ප්‍රමාණයෙන් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් ප්‍රමාද ගාස්තුවක් වශයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවීමට ගාස්තු එකතු කරන්නා යටත් වන බව,

(vii) ගිවිසුම්ගත වන අවස්ථාවේ ද අවසර පත්‍ර ගාස්තු අයකරන්නා විසින් තුන් මාසික කුලී මුදලට සමාන ආරක්ෂක ඇපතැන්පත් මුදලක් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු බව,

ගිවිසගත් කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

38. (i) ගාස්තු එකතු කරන්නා විසින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස දෙකක ගාස්තුවට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස ගාස්තු එකතු කරන්නාට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ii) 38 i ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ ගාස්තු එකතු කරන්නකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින හතක් ඇතුළත එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එකී දැන්වීම ඔහුට ලැබුණු දිනෙන් දින හතක් ඉකුත් වූ දින සිට එකී ගාස්තු එකතු කරන්නා සමග දෙහිඕවිට ප්‍රාදේශීය සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු වීම නීත්‍යානුකූල වන්නේ ය. එසේම එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැලකෙන දිනයේ ම එකී ගාස්තු එකතු කරන්නා වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) 38 ii ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව කවර හෝ අවස්ථාවක එකී ගිවිසුමේ පාර්ශ්වකරුවකු වන ගාස්තු එකතු කරන්නා විසින් එකී සති පොළෙහි වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තකුට අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබීම හෝ එකී අවසර පතක් නිකුත් කිරීම වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීම නොකළ යුතු ය.

(iv) 38 ii ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව එළැඹෙන දිනයේ සිට එකී සති පොළෙහි වෙළඳ ස්ථාන හා පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවසර පත්‍ර නිකුත් කරනු ලැබීමට සහ එකී අවසර පත්‍ර වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ කිසියම් බලයලත් නිලධාරියකු යෙදවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම බලයලත් නිලධාරියකු ලවා එකී කාර්යය තව දුරටත් කරගෙන යාමට නොහැකි වන බව ලේකම්වරයාගේ මතය වන විට 34 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා තමාගේ මතය සභාපතිවරයා මගින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු ය. ඒ ආකාරයෙන් ලේකම්වරයාගේ මතය සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී 34 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කිරීමට දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එසේ නොවන්නේ නම්, සභාවේ සභාපතිවරයා විසින් බලය දෙනු ලබන නිලධාරියකු විසින් සතිපොළ වෙළඳ ස්ථානයන්හි වෙළඳ කාර්යයේ නිරත වන්නන්ගෙන් අවසර පත්‍ර සඳහා ගාස්තු අයකිරීම නීත්‍යානුකූල වන්නේ ය.

39 . කිසියම් සති පොළක් පවත්වනු ලබන දිනයන් සහ වේලාවන් කවරේ ද යන්න භාෂාත්‍රයෙන් ම වූ දැන්වීමක් හෝ දැන්වීම ප්‍රකටව පෙනෙන ආකාරයෙන් එකී සති පොළට ඇතුල්වීමේ දොරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමට කටයුතු කළ යුතු ය.

40. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් සති පොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින්

සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ තැනැත්තෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

41. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කිසියම් සති පොළක් වෙළෙඳාම් කටයුතු සඳහා විවෘත කර තබනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

42. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද, වරදකරු කරනු ලැබීමකින් පසුව ද, එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව ද ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතු ය.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

*(අ)* "සති පොළ" යන්නෙන්, වෙළඳාමක නියුක්ත වීම සඳහා ඉදිකළ වෙළඳ පරිශ්‍ර හා තම තමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරු ද ඇතුළු වෙනත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇතිකර තිබෙන්නා වූ ද දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් වන අතර කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙන් මිලදී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

*(ආ)* "ගිවිසුම්කරු" යන්නෙන්, දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සමග ඇතිකර ගත් ගිවිසුමක් සහිතව කිසියම් සති පොළක යම් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු අදහස් විය යුතු ය.

*(ඉ)* "වෙළඳ ස්ථානය" යන්නෙන්, කිසියම් සති පොළක ගොඩනැගිලි තුළ පොළව මත ඉරි සලකුණු ඇඳීමෙන් වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

**සතිපොල වෙළෙඳ අයිතිය බඳුදීම සඳහා ගිවිසුම් පත්‍රයයි**

එක් පාර්ශවයකට (මෙහි මින්මතු) සභාපතිතුමා යනුවෙන් හඳුන්වනු ලබන..................................ප්‍රාදේශීය සභාවේ සභාපති................................සහ (මෙහි මින්මතු) ලේකම් යනුවෙන් සඳහන් වන........................ප්‍රාදේශීය සභාවේ ලේකම්....................යන අය ද ඇතුළු.......................................ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පෙනී සිටින්නා වූ හා ක්‍රියා කරන්නා වූ ..............................ප්‍රාදේශීය සභාවේ සභාපති හා ලේකම් ද අනිත් පාර්ශවයට (මෙහි මින්මතු) ගිවිසුම්කරු යනුවෙන් සඳහන්වන.............................. පදිංචි............................... යන අය අතර, වර්ෂ.........................................ක් වූ ............................ මස .................දී..................ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ඇතිකරගත් ගිවිසුම් පත්‍රයයි.

..........................ප්‍රාදේශීය සභාවට අයත්..........................පිහිටි සති පොළෙහි අංක ............................ දරන වෙළඳ ස්ථානය........................ වෙළඳාමක් පවත්වාගෙන යාම සඳහා යථෝක්ත වෙළඳ ස්ථානය පාවිච්චි කිරීමේ අයිතිය මින්මතු සවිස්තරාත්මකව දැක්වෙන කොන්දේසිවලට යටත්ව ගිවිසුම්කරුට පවරාදීමට..................................ප්‍රාදේශීය සභාව එකඟ වේ. මින්මතු වඩාත් සවිස්තරව දැක්වෙන සහ නියම කරනු ලබන අණපනත්වලට හා කොන්දේසිවලට යටත් ව ගිවිසුම්කරු වන......................... විසින් වෙළඳ ස්ථානය දීමනාකරු වන.............................ප්‍රාදේශීය සභාව සමග මෙම ගිවිසුමට අත්සන් කරනු ලබයි.

ගිවිසුම්කාර පක්ෂය විසින් වෙළඳ ස්ථානය දීමනාකාර පක්ෂය වන ............................................ප්‍රාදේශීය සභාවට ශ්‍රී ලංකාවේ භාවිතා වන වලංගු මුදලින් රුපියල්..............................මුදලක් ගිවිසුම්කාර පක්ෂය විසින් වෙළඳ ස්ථානය දීමනාකාර පක්ෂයට ගෙවිය යුතු ය....................................ප්‍රාදේශීය සභාවට අදාළ කොන්දේසි, අනපනත්, නීති රීති, අතුරු ව්‍යවස්ථාවලට සහ.....................ප්‍රාදේශීය සභාව විසින් වරින් වර ගනු ලබන සභා තීරණයන්ට යටත් ව ස්වකීය වෙළඳ ව්‍යාපාරය කරගෙන යාමේ අයිතිය.................වර්ෂයේ ....................මස.....................දින සිට ........................දින දක්වා වර්ෂයක කාලයක් භුක්ති විඳීම පිණිස ගිවිසුම්කාර පක්ෂයට හිමි වන්නේ ය. වෙළඳ ස්ථානය ගිවිසුම්කාර දෙපාර්ශවය විසින් ඔවුනොවුන් අතරේ පිළිපැදිය යුතු යුතුකම් හා වගකීම් ද මින් මතු දැක්වෙන ආකාරයෙන් පොරොන්දු වී පිළිගන්නා ලදුව මෙම ගිවිසුමට බැඳෙන ලදී.

කොන්දේසි.-

01. ..............................ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සැලැස්මකට අනුව සතිපොල වෙළඳ ස්ථානය වර්ග කිරීම සහ සිදුකරනු ලබන අංක කරණයට අනුව ගිවිසුම්ගත පාර්ශවය වන.........................මම අංක....................දරන වෙළඳ ස්ථානයේ වෙළඳ කටයුතු 20....................දින සිට ........................දින දක්වා පවත්වාගෙන යාම සඳහා එකඟ වෙමි.

02. ...........................මස.......................දින සිට....................වර්ෂයේ..................මස ..........................දින දක්වා සතිපොලෙහි වෙළඳ ස්ථානය සඳහා ස්ථාන වෙන්කර දීම වෙනුවෙන් ආපසු නොගෙවන රුපියල්..................මුදලක් දීමනාකරුවන.........................සභාව වෙත ගෙවීමට ගිවිසුම්කාර පාර්ශවය වශයෙන්..........................වන මම එකඟ වෙමි.

03. මෙම අංක........................දරන වෙළඳ ස්ථානය සඳහා ගෙවිය යුතු දෛනික ටිකට්පත් ගාස්තුව මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීම හේතු කොටගෙන.....................සභාව වෙත පැවරී ඇති බලතල යටතේ අවලංගු කරනු ලැබුවහොත් හෝ ගිවිසුම්කරු විසින් සිය කැමැත්තෙන් අවලංගු කරගන්නා තුරු සතිපොල වෙළඳ කටයුතුවල නිරතවෙන සෑම දිනයක් සඳහා ම රු................................ මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

04. වසරකට වරක් හෝ අවශ්‍යයයි ප්‍රාදේශීය සභාව අදහස් කරන වෙනත් ඕනෑම අවස්ථාවක දෛනික ටිකට්පත් ගාස්තුව හා ආපසු නොගෙවන එකවර ගෙවන වෙළඳ ස්ථාන වෙන්කර දීමේ ගාස්තුව ප්‍රතිශෝධනය කිරීමට.....................ප්‍රාදේශීය සභාවට බලය ඇත. .....................සභාව විසින් නියම කරනු ලබන දින සිට එසේ ප්‍රතිශෝධනය කරනු ලබන දෛනික ටිකට් පත් ගාස්තු ගෙවීම සඳහා ගිවිසුම්ගත පර්ශවය එකඟ වේ.

05. වෙළඳාමේ නිරත වන දිනයක දී ටිකට් පත් ගාස්තුව නොගෙවා වෙන්කර දී ඇති වෙළඳ ස්ථානයේ වෙළඳ කාර්යයේ නිරත වන ඕනෑම අයෙකු වෙළඳ ස්ථානයෙන් නෙරපා දැමීමට ....................ප්‍රාදේශීය සභාව ක්‍රියා කරනු ලැබේ.

06. ගිවිසුම්ගත පාර්ශවකරුට අවශ්‍යවන්නේ නම් ලිත් මසක් කල්දීමකින් පසු ගිවිසුම අවලංගු කරවා ගැනීමට හැකි අතර, එසේ ගිවිසුම අවලංගු

කිරීමක දී ගිවිසුම අවලංගු කරගන්නා අවස්ථාව දක්වා සභාව වෙත ගෙවීම් කර ඇති කිසිදු මුදලක් ආපසු ඉල්ලා සිටීමේ අයිතිවාසිකමක් ගිවිසුම්ගත පක්ෂයට නොමැත්තේ ය. වෙළඳ ස්ථානය වෙන්කර ගැනීමේ දී එකවර තැන්පත් කළ මුදල ගිවිසුම අවලංගු කිරීමේ කාර්ය සඳහා කවර හෝ අවහිරතාවයක් හෝ බලපෑමක් සිදු නොවිය යුතු අතර, එවැනි අවලංගු කිරීමක දී ගිවිසුම්කරු විසින් ගෙවා ඇති මුදල් ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටීමට ගිවිසුම්කරුට අයිතියක් නොමැත.

07. ගිවිසුම්කරු ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා විසින් ඕනෑකමින් හෝ ස්වකීය පැහැර හැරීමක් හෝ නොසැලකිලිමත් භාවයක් හේතු කොටගෙන තමා ගිවිසුම්ගතව වෙන්කරගෙන ඇති වෙළඳ ස්ථානය තුළ හෝ ගිවිසුම්ගත පාර්ශවකරුවන්ගේ පාවිච්චිය සඳහා වෙළඳ ස්ථානවලින් පිටත පොදු වෙළඳ පලේ සවිකර ඇති විදුලි, ජල උපකරණ, පිරිද්දුම් වානේ දැල්, දොර ජනෙල්, ගේට්ටු යනා දී........................සභාව සතු දේපලකට අලාභහානියක් සිදු නොකළ යුතු ය. තව ද ගිවිසුම්කරුගේ ගිවිසුම අවලංගුවීමක දී ගිවිසුම්කරු විසින් සපයා තබාගෙන සිටි උපකරණ සියල්ල ඉවත් කරගෙන යාමේ දී සභාවේ යම් දේපලකට අලාභ හානියක් සිදු නොකළ යුතු ය. තව ද ගිවිසුම්කරුගේ ගිවිසුම අවසන් වීමක දී ගිවිසුම්කරු විසින් සපයාගෙන සිටි උපකරණ ඉවත් කරගෙන යාමේ දී සභාවේ යම් දේපලකට නොසැලකිලිමත් කම හේතු කොටගෙන කවර හෝ ආකාරයක යම් අලාබයක් සිදු වීමට අවකාශ නොතිබිය යුතු ය. එවැනි හානියක් සිදුකරනු ලැබුවහොත්...................සභාවේ නිලධාරීන් විසින් එම හානිය සම්බන්ධයෙන් දෙනු ලබන තක්සේරු වටිනාකම..........................සභාවට ගෙවනු ලබන ලෙස නියම කරනු ලැබූ වහාම බදුකරු විසින් ගෙවිය යුතු වේ. ගිවිසුම්කරු සතු භාණ්ඩ හෝ උපකරණ වලට සිදු වන කුමන හෝ අන්දමේ හෝ අලාභහානියක් සඳහා සභාව වගකියනු නොලැබේ.

08. ගිවිසුම්කරු වෙළඳ ස්ථානයෙහි යම් කොටසක බුක්තිය අන්‍යයෙකුට විකිණීම පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ සභාවේ අවසරයක් නොමැතිව එයින් ඉවත් වීම නොකළ යුතු ය. ගිවිසුම්කරු විසින් වෙළඳ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන වෙළඳාම හෝ ඉන් කොටසක් විකිණීම, මාරු කිරීම, හවුල් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම හෝ උකස් කිරීම නොකල යුතු ය.

09. නගාරාධිපති/සභාපති හෝ ඔහුගේ බලයලත් නිලධාරින්ට හා සේවකයින්ට වෙළඳ ස්ථානයට ඇතුල් වීමට ගිවිසුම්කරු විසින් ඉඩදිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ද ගිවිසුම්කරු විසින් ඔවුන්ට සලසා දිය යුතු යි.

10. ගිවිසුම්කරු විසින් මෙම වෙළඳ ස්ථානය හෝ පොදු වෙළඳපලේ කිසියම් කොටසක නිර්මානාත්මක හෝ වෙනත් ආකාරයක වෙනස් කිරීමක් කවර අන්දමකින් හෝ නොකළ යුතු අතර, නගරාධිපති/සභාපතිතුමාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබානොගෙන ගිවිසුම්කරු විසින් ස්ථිර හෝ තාවකාලික සවිකිරීම් හා පිරිද්දීම් ආදියත් සවිකිරීම් හෝ ස්ථාපනය කිරීම් නොකළ යුතු ය.

11. වෙළඳ ස්ථානය පිරිසිදුවත්, සනීපාරක්ෂාවට හිතකර අන්දමටත් සවිකිරීම් සඳහා අවශ්‍යයයි..................සභාවේ නිලධාරින් විසින් කල්පනා කරනු ලබන සියළුම ආකාරයේ උපකරණ ද, බඳුන් ද ගිවිසුම්කරු විසින් තමාගේ වෙළඳ පරිශ්‍රය තුළ සපයා තිබිය යුතු යි.

12. ගිවිසුම්කරු විසින් ජලාප්‍රවාහන ක්‍රමයට හෝ කසල කාණුවලට බාධා ඇතිවන අයුරු හෝ ඒවායේ ක්‍රියාකාරිත්වය ඇණ සිටින අයුරු කාණුවලට හෝ බේසන්වලට හෝ අනිකුත් භාජනවලට හෝ ජලාප්‍රවාහන ක්‍රමයට යම්කිසි ද්‍රව්‍යයක් හෝ යම් කිසිවක් විසි කිරීම හෝ හැලීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

13. කැලි කසල හෝ අමතර ද්‍රව්‍ය ඒවා දැමීමට නියම ස්ථානයෙහි මිස විසිකර දැමීම හෝ තැන්පත් කිරීම නොකළ යුතු ය.

14. යම්කිසි වෙළඳ ස්ථානයක ඇතුල් පැත්තෙන් හෝ පිටපැත්තෙන් හෝ බිත්තිවල, කණුවල ප්‍රචාරක දැන්වීම්, දැන්වීම් පත්‍රිකා ඇලවීම හෝ සවිකිරීම හෝ නොකළ යුතු ය. කිසියම් වෙළඳාමක හෝ ව්‍යාපාරයකට අදාල යම් සංඥා නාම පුවරු හෝ වෙනත් ප්‍රදර්ශන පුවරු වෙතොත්..............සභාවේ නගරාධිපති/සභාපති විසින් අනුමත කරනු ලබන ස්ථානවල සහ අනුමත කරන ආකාරයට පමණක් ඒවා අලවා ප්‍රදර්ශනය කළ යුතු ය.

15. ගිවිසුම්කරු විසින් යම්කිසි උපකරණ හෝ භාණ්ඩ ආදිය තම වෙළඳ ස්ථානයේ වහලය මත නොතැබිය යුතු ය.

16. යම් වෙළඳ ස්ථානයක සීමාවෙන් පිටතට යන පරිදි කුමන ස්වභාවයක හෝ ද්‍රව්‍ය හෝ උපකරණ ගොඩගැසීම හෝ තැන්පත් කිරිම නොකළ යුතු ය. වාහනවලින් ප්‍රවාහනය කරනු ලබන බඩු උපකරණ හෝ ද්‍රව්‍ය වෙළඳ ස්ථානය වෙත අප්‍රමාදව රැගෙන යා යුතු ය.

17. යුක්තිසහගතව අවශ්‍ය වන කාලසීමාවට වැඩිමනත් කාලයක් වෙළඳ ස්ථානයකට භාණ්ඩ හෝ ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන සතිපොල වෙළඳසැල් භූමියේ නවතා තැබීම හෝ නවතා තැබීමට ඉඩ හැරීම නොකල යුතු ය.

18. සතිපොල පැවැත්වෙන දිනට පෙරදින ප. ව. 3.00 සිට සතිපොල පැවැත්වෙන දිනට පසුදින පෙ. ව. 9.00 දක්වා පොළ පරිශ්‍රය විවෘතකර තබනු ලබන අතර, එකී වේලාව තුළ හැර වෙනත් වේලාවන් තුළ ගිවිසුම්කරුවන්ට හෝ ඔවුන්ගේ සේවකයින් කිසිවකුට වෙළඳ ස්ථානයේ හෝ වෙළඳ පරිශ්‍ර ගොඩනැගිල්ලේ රැඳී සිටීමට අයිතියක් නැත.

19. ගිවිසුම්කරු හා/හෝ ඔහුගේ සේවකයෙකු කිසියම් අහිතකර හෝ බෝවන රෝගයකින් පෙලෙන්නේ යයි සැක කරන විට නිසි වෛද්‍ය පරීක්ෂණයක් සඳහා තම ඉදිරිපත් වීම හෝ එම සේවකයා ඉදිරිපත් කිරීම කළයුතු අතර, සභාවේ බලයලත් නිලධාරියකු විසින් වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙනු ලැබූ විට වහාම එකී ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ. ගිවිසුම්කරු බෝවන රෝගයකින් හෝ අහිතකර රෝගයකින් පෙලෙන විට වෙළඳ ස්ථානයේ මොනයම් කටයුත්තකටවත් සහභාගි නොවිය යුතු අතර, එවැනි රෝගයකින් පෙලෙන සේවකයෙකු ද සේවයේ යොදවා ගැනීම නොකළ යුතු ය.

20. ගිවිසුම්කරු ඔහුගේ නියෝජිතයින් හා සේවකයින් විසින් මෙම පොරොන්දු පත්‍රයේ අන්තර්ගත කොන්දේසි ද සභාව විසින් පනවා ඇති පොදු සතිපොල පිළිබඳ අතුරු ව්‍යවස්ථා හා ඉදිරියේ දී පනවනු ලබන අතුරු ව්‍යවස්ථා වෙතොත් ඒවා ද, වෙනත් අණපනත්වලින් නියම කෙරෙන විධිවිධාන ද කඩනොකළ යුතු අතර, එකී කවර විධිවිධානයක් හෝ කඩකරනු ලැබුවහොත් එය මෙම ගිවිසුම අවලංගුකර බදුකරුගේ බදු අයිතිය ද අහෝසිකර මෙම වෙළඳ ස්ථානය සභාවට පවරා ගැනීමට හේතු වනු ඇත.

21. මීට අත්සන්කොට ඇති පාර්ශවකාරයන් අතර යම් මත බේදයක් හෝ විරෝධතාවයක් හෝ පැන නැගුනහොත් එකී මතබේදයන් හෝ විරෝදතාවයන්................................පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතුවාක් හැර මෙහි මින් මතු සටහන් කොට ඇති ප්‍රකාරව මොනම පාර්ශවකාරයෙකු විසින් වුව ද, ඒ පිළිබඳ බේරුම් කිරීමේ විනිශ්චයක් සඳහා ඉල්ලීමක් කොට තිබේ නම් මිස නැත්නම් ඔවුන්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. නමුත් එම ලේකම්ගේ තීරණය

යම්කිසි පාර්ශවකරුවෙකුට දැනුම් දෙනු ලැබූ දින සිට දින 07ක් ඇතුලත දී ඒ පාර්ශවකාරයා විසින් ලියවිල්ලකින් එසේ ඉල්ලීමක්කර සිටියහොත් එම ලේකම්වරයා විසින් මතබේදයට හේතු වූ කාරණය ගැන විභාගකොට විනිශ්වයක් දීමට සුදුසු අයෙකු පත්කරනවා ඇත. 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත මෙම කරුණේ දී අදාල කරගනු ලැබේ. නීතිය පිළිබඳ වුවත්, ප්‍රස්තුත කාරණය පිළිබඳ වුවත් එකී අයගේ තීරණය නොහොත් විනිශ්වය අවසාන තීරණය නොහොත් විනිශ්වය වන්නේ ය. මීට සම්බන්ධ වූ පාර්ශවකාරයින් විසින් එකී තීරණය හෝ විනිශ්වය පිළිගත යුතු ය.

වර්ෂ.......................වූ.......................මස............................දින එකී දෙපාර්ශවය විසින් පහත සාක්ෂිකරුවන් අභිමුඛයේ දී මෙම ගිවිසුම් පත්‍රයට ඔවුන්ගේ අත්සන් තබන ලදී.

| ............................ | ............................ | ............................ |
|---|---|---|
| නගරාධිපති/සභාපති | නාගරික කොමසාරිස්/ලේකම් | ගිවිසුම්කරු |

.................................සභාව .............................................සභාව

*සාක්ෂි.-*

1. අත්සන :.................................................
   නම සහ ලිපිනය :..........................................

2. අත්සන :.................................................
   නම සහ ලිපිනය :..........................................

*පළමුවන උපලේඛනය*

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සතිපොළ වෙළඳාම් කරගෙන යාම සඳහා කඩ කාමර/ස්ථාන ලබාදීමේ අවසර පත්‍රය**

01. සම්පූර්ණ නම :—————.
02. ලිපිනය :—————.
03. හැඳුනුම්පත් අංකය :—————.
04. කඩකාමර අංකය :—————.
05. වෙළඳාමේ ස්වභාවය :—————.
06. සේවක/සහායක ප්‍රමාණය :—————.

| | *සේවක සහායක නම* | *හැඳුනුම්පත් අංකය* |
|---|---|---|
| (i) | ............................ | ............................ |
| (ii) | ............................ | ............................ |
| (iii) | ............................ | ............................ |
| (iv) | ............................ | ............................ |

ඉහත සඳහන් තොරතුරු මත දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තල්දූව සතිපොළෙහි කඩකාමර/ස්ථාන අංක ......................දරන ස්ථානයේ ................වෙළඳාම සඳහා .........................දින සිට........................දින දක්වා කාලය සඳහා ප්‍රාදේශීය සභාව හා බැඳුනු ගිවිසුම ප්‍රකාරව අවසර ලබා දෙමි.

....................................
සභාපති/ලේකම්,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

12-29

# තනතුරු - ඇබෑර්තු

**මධ්‍යම පළාත් සභාවේ - සභා ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් තනතුර**

මධ්‍යම පළාත් සභාවේ - සභා ලේකම් කාර්ය මණ්ඩලයේ සහකාර ලේකම් තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති දැනට රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) සුදුසුකම් :-
(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරියකු වීම ; හෝ

(ii) සාමාන්‍ය ලිපිකාර සේවයේ අවුරුදු 20ක සේවා කාලයක් සපුරා ඇති මාණ්ඩලික නිලධාරියෙකු වීම,

(2) වැටුප :-
(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ අයෙකු නම් ශ්‍රී.ලං.ප.සේ. II ශ්‍රේණියේ වැටුප් ක්‍රමයේ පිහිටුවීමටත්,

(ii) සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ නිළධාරියකු නම් ශ්‍රී.ලං.ප.සේ. III ශ්‍රේණියේ වැටුප් ක්‍රමයෙහි පිහිටුවීමටත් කටයුතු කරනු ලැබේ.

(3) අයදුම්පත් :- ඔබේ අයදුම්පත පහත සඳහන් ආකෘතියට අනුව සකස්කර, 2013.12.17 දිනට පෙර පහතින් දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්න සැලැස්විය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි - "සහකාර ලේකම් තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

මහින්ද අබේකෝන්,
සභාපති,
මධ්‍යම පළාත් සභාව.

*අයදුම්පත් එවිය යුතු ලිපිනය.-*

සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව,
තැ. පෙ. 07,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

ආදර්ශ අයදුම්පත

***මධ්‍යම පළාත් සභාවේ - සභා ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් තනතුර***

(1) නම :—————.
(2) උපන් දිනය :—————.
(3) ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
(4) ලිපිනය :

| *රාජකාරි* | *පෞද්ගලික* |
|---|---|
| ................................................ | ....................................................... |
| ................................................ | ....................................................... |
| ................................................ | ....................................................... |

(5) (i) මුල් පත්වීමේ දිනය :—————.
(ii) මුල් පත්වීම ලැබූ තනතුර :—————.
(iii) දැනට දරන තනතුර :—————.
(iv) දැනට දරන තනතුරට පත් වූ දිනය :—————.

(6) සුදුසුකම්.-

(අ) ශ්‍රී.ලං.ප.සේ. අයෙකු නම්.-

(i) දැනට සිටන පන්තිය/ශ්‍රේණිය :—————.
(ii) පත්වූ දිනය :—————.

(ආ) කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ අයෙකු නම් ඃ

(i) මුල් පත්වීමේ දිනය :—————.
(ii) අධි පන්තියට පත් වූ දිනය :—————.

(ඇ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :—————.

(ඉ) වෘත්තීමය සුදුසුකම් :—————.

(7) වෙනත් සුදුසුකම්.-

මවිසින් ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම ආයතනයේ.........................ලෙස සේවය කරනු ලබන බවත්, ඔහු/ඇය විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඉහත තනතුර සඳහා තෝරා පත්කර ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කිරීමට එකඟ බවත් සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියා.
නම :—————.

දිනය :—————.

12-178

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ ජේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| *අති විශෙෂ ගැසට් පත්‍රය* ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013 වර්ෂය** | | | |
| දෙසැම්බර් | 2013.12.06 | සිකුරාදා | 2013.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.13 | සිකුරාදා | 2013.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.20 | සිකුරාදා | 2013.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.27 | සිකුරාදා | 2013.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2014 වර්ෂය** | | | |
| ජනවාරි | 2014.01.03 | සිකුරාදා | 2013.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.10 | සිකුරාදා | 2013.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.17 | සිකුරාදා | 2014.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.24 | සිකුරාදා | 2014.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.01.31 | සිකුරාදා | 2014.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2014.02.07 | සිකුරාදා | 2014.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.13 | බ්‍රහස්පතින්දා | 2014.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.21 | සිකුරාදා | 2014.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.02.28 | සිකුරාදා | 2014.02.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.